

• ක්ෂේත්‍ර පුරාවිද්‍යාව

උඩවලව නිම්නයේ පුරාවිද්‍යාව . . . . 2



• පුරාවිද්‍යාඥයෝ

පී.ඊ.පී. දැරණියගල . . . . 5



• පුරාවිද්‍යා ක්ෂේත්‍ර

බණ්ඩත්තර මැටිඔරු . . . 12



කාණ්ඩය 2 | කලාපය II | 2011 අප්‍රේල් - ජූනි

ISSN 2012 - 7189

ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාව

මානව යටගියාවේ අත්මුල් සොයා යන ත්‍රෛමාසික විද්‍යුත් සඟරාව


# දිනිති

## සකසු සටහන



ජූනි මාසයේ 17 වන සිකුරාදා දින පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන ශ්‍රවණාගාරයේ දී ලංකාවේ පුරාවිද්‍යා පර්යේෂණ කෘති අතරට නවතම කෘතියක් එක් විය. ඒ මහාචාර්ය රාජ් සෝමදේව මහතා විසින් වසර ගණනාවක් තිස්සේ උඩවලව නිම්ණයේ සිදුකරමින් පවතින පුරාවිද්‍යා ගවේෂණ හා පර්යේෂණවල නවතම ප්‍රතිඵල ඇතුළු කරමින් සකස් කරන ලද Archaeology of the Uda Walave Basin කෘතියයි. ලංකා අතීතය තුළ තීරණාත්මක අවධියක් වන ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික යුග අතර ඇති සංක්‍රාන්ති අවධිය පිළිබඳ ව පැවැති ගැටළු සඳහා පර්යේෂණාත්මක පිළිතුරු සැපයීම මෙම ග්‍රන්ථයේ උත්සාහය වී ඇත. උක්ත ග්‍රන්ථය දැනුම් පද්ධතියක් ලෙස මෙන් ම දැනුම් මූලයක් වශයෙන් උපකෘත කොට ගැනීමේ හැකියාවෙන් යුතු බව ආචාර්ය සිරාන් දැරණියගල මහතා විසින් ග්‍රන්ථය දොරට වැඩුමේ දී පෙන්වා දෙනු ලැබින. එබැවින් මෙම උත්සාහය ශුද්ධවිභාගාත්මක වශයෙන් ද ලාංකේය පුරාමානවයා පිළිබඳ කතාවේ දී වැදගත් වන බව තහවුරු වේ. එම කරුණු නිසාම මෙම කෘතිය බැරෑරුම් ලෙස විද්වතුනගේ අවධානයට ලක්විය යුතු බව *දිනිතිගේ* අදහසයි.

තත් ග්‍රන්ථයේ දොරට වැඩුමේ දී ගණිතය පිළිබඳ මහාචාර්ය නලින් ද සිල්වා මහතා විසින් දැක් වූ අදහස් ද ලක්දිව පුරාවිද්‍යාඥයින්ගේ අවධානයට ලක් විය යුතු බව අපගේ අදහසයි. එනම් මානව පරිණාමය හා විකාශය පිළිබඳ බටහිර මොඩලයෙන් ඉවත් වී දේශජ ආකෘතික ප්‍රවේශයක් තුළ ලාංකේය මානව ගතිකය හඳුනාගැනීමට උත්සාහ දැරිය යුතුය යන්නයි. පුද්ගලත්වය පසෙක තබා උක්ත කරුණ පිළිබඳ අවධානයක් යොමුකිරීම ලාංකේය පුරාවිද්‍යාවේ උන්නතිය සඳහා මිස අවනතිය සඳහා හේතු නොවේ. ඒ අනුව සලකා බැලීමේ දී උක්ත පර්යේෂණාත්මක කෘතිය දේශීය මොඩලයක් තුළ මානව විස්තීර්ණය හා සංක්‍රමණ රටා තේරුම්ගැනීමට ගත් උත්සාහයක් වශයෙන් ද එක් අතකින් හඳුනාගැනීමට හැකි වීම මෙහි වටිනාකම තවත් ඉහළ දැමීමට හේතු වී ඇත.

නැවැත වරක් ලංකාවේ පුරාවිද්‍යාඥයෙකු විසින් හරවත් පර්යේෂණ කෘතියක් සමාජගත කිරීමට සමත්ව ඇත. දැන් කළ යුත්තේ එම චින්තනාත්මක ප්‍රවේශය හා එළඹුම් පෘතුල දේශජ සුසමාදර්ශයක් තුළ බහා එය තවදුරටත් වර්ධනය කිරීම හෝ විවෘත ශාස්ත්‍රීය සංවාදයක් තුළ නිර්මාණය කරන එහි ප්‍රති තීසිසයක් ඔස්සේ එය අතික්‍රමණය කිරීමට උත්සාහ දැරීම මිස ප්‍රලාප දෙඩීම හෝ ඒ පිළිබඳ උකටලි වීම නොවේ. අද දවසේ පුරාවිද්‍යාඥයාගේ කාර්යය අතර ප්‍රමුඛ ස්ථානයක් ඒ සඳහා ලබාදීම අනිවාර්ය වේ.

සංස්කාරක

**පී.ඊ.පී. දැරණියගල මහතා විසින් රුක්අත්තන දැවයෙන් නිර්මාණය කළ බලංගොඩ මානවයාගේ කැටයමක්,**
ලන්ඩනයේ පිහිටි බ්‍රිතාන්‍ය ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත. (අනුග්‍රහය කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


archaeology.lk

දොරට වැඩුමකි

(නොමිලේ බෙදාහැරෙන්නකි)

මෙහි පළවන ලිපිවලින් දැක්වෙන්නේ ඒ එක් එක් ලේඛකයාගේ අදහස් බව සැලකුව මනාය.

සංස්කරණය
චන්දිම අඹන්වල

කර්තෘ මණ්ඩලය
මහින්ද කරුණාරත්න

තොරතුරු තාක්ෂණික සේවා
අනුරාධ පියදාස



විද්‍යුත් ලිපිනය
dinithi@archaeology.lk

ලිපිනය
සංස්කාරක,
දිනිති - ශ්‍රී ලංකා පුරාවිද්‍යාව,
අංක 47,
ශ්‍රී සුමංගල මාවත-දකුණ,
කළුතර උතුර

**2011 ජූනි මස 17 සිකුරාදා දින පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලද Archaeology of the Uda Walave Basin පොත දොරට වැඩුමේ උළෙලේ දී ආචාර්ය සිරාන් දැරණියගල මහතා විසින් පවත්වන ලද ප්‍රධාන විමසුම් දේශනය**

# උඩවලව නිම්නයේ පුරාවිද්‍යාව

පොතේ නම : Archaeology of the Uda Walave Basin
කර්තෘ : මහාචාර්ය රාජ් සෝමදේව
ප්‍රකාශක : පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ 7


ගරුතර මහා සංඝරත්නයෙන් අවසරයි,

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ සභාපති ප්‍රමුඛ ජාතික උරුම ඇමතිතුමා ප්‍රමුඛ සම්භාවනීය අමුත්තන්ගෙන් අවසරයි. නොනාවරුනි මහත්වරුණි.

කතාව කිරීමට ආරාධනාව ලැබුනට මට අද වනතුරු පැහැදිලි අදහසක් තිබුනේ නැහැ මගෙන් මොකක්ද බලාපොරොත්තු වුනේ කියල. මම රෑ තිස්සේ පොත කියවකියව පිටුවෙන්පිටුවට සටහන් ලියාගත්තා අපි අපි අතර අදහස් හුවමාරුවක් තිබෙයි කියල. විවේචන ද අරක ද මේක ද. බැනුම් අහගන්නයි සූදානම්වයි මම ආවේ. මේ විදිහේ උත්සවයක් තිබෙයි කියල මගේ බලාපොරොත්තුවක් තිබුන් නැ. ඒ නිසා සමාවෙන්න සූදානම් නැති බවක් මම අද පෙන්නුවොත්.

මේ මාතෘකාව එච්චරකට වැදගත්, සැලකිය යුතු වැරදි තැනක් නෑ. අද දින මේ ග්‍රන්ථයේ කර්තෘ මහාචාර්ය සෝමදේව මහත්මයා ඉතා උචිත අන්දමට සාරාංශ කෙරුවා මෙතෙක් පවත්වලා තියෙන 2006 පටන් පවත්වාගෙන යන පර්යේෂණ මාලාව පිළිබඳව. ආය ඒකට එකතුකරන්න දෙයක් නෑ. ඉතාමත්ම පැහැදිලි අන්දමට අද සාරාංශ කෙරුවා. ඇත්තටම පොතේ තියෙනවට වඩා පැහැදිළිව සාරාංශ කෙරුවා අද එතුමා. ඒක එක විවේචනයක්.

දැන් මේකේ සන්දර්භය නැතිනම් අද නිමා කරපු පොතේ කටයුත්ත, උත්සාහය වැටෙන්නේ කොහාටද කියල කෙටියෙන් මම පැහැදිලි කලොත් වැදගත්. ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ කොන් දෙකක් තියෙනවා. ඒ කියන්නේ අපේ මධ්‍යශිලා නැතිනම් මෙසොලිතික යුගයට එහාට ගෙනියන්න අසමත්කමක් තිබුණා. පැලියෝලිතික කියල යුගයක් තිබුනා කියල අපි දැන් පැහැදිළිවම පෙන්නලා තියෙනවා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පර්යේෂණ වලින්. ඒ කියන්නේ ඉරණමඩු, මාන්කුලම්





ආචාර්ය සිරාන් දැරණියගල මහතා මුඛ්‍ය දේශනය පවත්වමින්

කියන ප්‍රදේශයේ තියෙන ස්ථානවලිනුයි දකුණේ බූන්දල කියන ස්ථානවලිනුයි ඒක අපි පැහැදිළිව පෙන්නලා තියෙනවා. ඒ වගේම ආචාර්ය නිමල් පෙරේරා මහත්තයත් එතුමාගේ ලෙන් කැනීම්වලිනුත් දැන් ඔප්පු කරල තියෙනවා. සමහර විට ලක්ෂ 2ක් 3ක් පැරණි ඒවා තියෙනවා. මෑතක දී යාපන අර්ධද්වීපයෙන් සොයාගෙන තියෙනවා ඉන්දියාවේ ඇචූලියන් සම්ප්‍රදායට සමාන ගල් ආයුධ වගයක්. බැලූ බැල්මට ලක්ෂ 6කට එහා. ලක්ෂ 6කටත් 16කටත් අතරේ වගේ පෙනෙන්නේ. හැබැයි එක ගල් ආයුධයයි ලැබිල තියෙන්නේ. තව දුරට මේ පරීක්ෂණ පවත්වාගෙන යා යුතුයි. ඒ කියන්නේ එක ටොන්ගලයක්.

අනික් ටොන්ගලේ තියෙන්නේ මහාචාර්ය සෝමදේවතුමා අද කිව්වා වාගේ මේ ශිලා යුගයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ පරිවර්තනය වුනේ ඓතිහාසික යුගයට කොයි ආකාරයටද කියල. දැන් එතනත් තියෙනවා ඓතිහාසික යුගය කියල දැන් අපි අලුතින් අනුරාධපුරය ඇතුළුනුවර කැනීම් කරල හිටන් ඓතිහාසික යුගයේ ආරම්භය ක්‍රිස්තු පූර්ව 250ට නෙවෙයි. ඒ කියන්නේ අසෝක රජ්ජුරුවන්ගේ කාලයේ නෙවෙයි දේවානම්පියතිස්ස රජ්ජුරුවන්ගේ කාලයේ නෙවයි ඊට අවුරුදු 300කට ඉහත දී ආරම්භ වුනා කියල හිටන් අනුරාධපුරයේ ඇතුළුපුරයේ අපේ කැනීම් වලින් අපි ඔප්පු කරල තියෙනවා. නමුත් ඉන්දියාවේ තාම කරල නෑ. අක්ෂර භාවිතය ලංකාවේ ක්‍රිස්තු පූර්ව 500ටත් 600ටත් අතර තිබුන කියල ඔප්පු කරල තියෙනවා. ඊට එහා තිබුනා යකඩ යුගය. අක්ෂර භාවිතයක් තිබුනේ නෑ. පූර්ව ඓතිහාසික යකඩ යුගය. දැන් මේ යුගය ගැන වැඩිය පර්යේෂණ කෙරිල නෑ.


ඇත්තටම මුළින් හිතුවේ මේ රට පුරාම තියෙනවා මෙගලිතික සොහොන් මේවා යකඩ යුගයට අයිතියි කියල හිතාගෙන හිටියේ. එත් අපි දැන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කැනීම් මගින් පෙන්නුම් කරල දීල තියෙනවා කාබන් 14 කාලනීර්ණයෙන් සෑහෙන තොගයක් මේ මෙගලිතික සොහොන් වැටෙන්නේ ඓතිහාසික යුගයට. දුටුගැමුණු රජ්ජුරුවන්ගේ කාලයට. ක්‍රිස්තු පූර්ව දෙවන ශතවර්ශයට. ඉතාම ස්වල්පයයි ක්‍රිස්තු පූර්ව 400යෙන් එහාට යන්නේ. එකයි ද කොහෙද. ඉබ්බන්කටුව හැර මට හිතෙන් නෑ ඔය එක මෙගලිතික සොහොනත්වත් පූර්ව ඓතිහාසික යුගයට වැටෙන් නෑ. ලොකු වරදක්. අනික් එක අනුරාධපුරයේ ඇතුළු නගරයේ ක්‍රිස්තු පූර්ව 900ට අපි යකඩ යුගය ගෙනිච්ච. එතන තියෙනවා. ක්‍රිස්තු පූර්ව 500 පටන් 900 වෙනකන්  මේ යකඩ යුගය තියෙනවා. අක්ෂර භාවිතයක් තිබුන් නෑ. මෙගලිතික සංස්කෘතියක් තිබුණ කියන එක වැරදියි. වෙන වෙන අය වැරදි ආකල්පයක් ගන්නවා මම මේක කියාපු ගමන්. වැඩිපුර කියන්න යන්නත් ඕන නෑ ඕක ගැන. පරිවර්තනය යකඩ යුගය නැත්නම් මේ අයස් යුගය. පූර්ව ඓතිහාසික යකඩ යුගය. මෙගලිතික කියාපු ගමන් හිතන්නේ මේ ගල් සොහොන් ඔක්කොම අයිතියි කියල දකුණු ඉන්දියාවෙන් කෙළින්ම මෙහාට ගෙනාපු සංස්කෘතියක් කියල. ඒකට මම විරුද්ධයි. කොච්චර කිවුවත් අහන්නෙත් නෑ. තව කියනව මෙගලිතික කියල. මෙගලිතික කියල කියන්නේ උපාංග සම්ප්‍රදායක්. ඊට අමතර දෙයක් නෑ ඒකේ. නමුත් අපුරාධපුරයේ අපේ කැනීම් වලින් අපි පැහැදිළිව පෙන්නලා තියෙනවා අඩි හයක් විතර තියෙනවා පස් ස්තර මේ යුගයට අයිති. ක්‍රිස්තු පූර්ව 900 පටන් 500/600 වෙනකල්. දැන් ඒ ටික හරි. දැන් ප්‍රශ්නයක් තිබුනා ශිලා යුගයේ ප්‍රාග් ඓතිහාසික හා යකඩ යුගය අතර මොකක්ද කියල වුනේ. අර සෝමදේව අද පෙන්නලා දුන්න වගේ මෙතන ලොකු හිඩසක් තියෙනවා. පරියේෂණ හිඩසක්. මන්නාරමේ 1982 කැනීමේ එක අත්හදාබලන කැනීමක් අපි අඩියටම බැස්සුවා. එච්චරයි අපට බස්සගන්න පුළුවන් වුනේ 1984 දී කලබල නිසා. ඒකේ අඩියෙන්ම ලැබුනා බැලූබැල්මට ප්‍රාග් ඓතිහාසික මට්ටමක්, වාසස්ථානයක්. අපි ඒක කාබන් 14 ක්‍රමයට කාලනීර්ණය කෙරුවහම ක්‍රිස්තු පූර්ව 1,800ට වැටුනේ. විශේෂයෙන් ම තිබුනේ ජ්‍යාමිතික ක්ෂුද්‍රශිලා මෙවළම්. ඊට අමතරව සත්තුන්ගේ ඇටකටු තිබුනා. ආය ඒවත් සමඟ තිබුන ලෝහ උණුකරපු අපද්‍රව්‍යය. ලෝකඩ අපද්‍රව්‍ය. අපි ඒව ගැනත් හෙවුව. ඉන්දියාවේ මෙවුවට කියන්නේ කැල්කොලිතික කියල. ගල් ආයුධයි ලෝකඩයි දෙකම තිබුණ කියල අපි පෙන්නල දීල තියනවා. හැබැයි සමහරු කිව්ව මේ ලෝකඩ කෑලි වැටිල තියෙන්නේ උඩ තට්ටුවකින් කොහොම හරි ආව කියල. අපේ ඒව පිළිගත්තේ නෑ. තවත් සාධකයක් තියෙනවා මේ මට්ටමින්. ඒ කාලේ මම දැනගෙන හිටියේ නෑ. කටුගෙයි සිටිය පී. බී. කරුණාරත්න මහත්මයා එළුවන්ගේ ඇටකටු හොයාගෙන තියෙනවා මේ මට්ටමින්. කවුරුවත් ඒකත් පිළිගත්තෙත් නෑ. ඕක මට කිවුවෙත් නෑ. නැත්නම් මම ඒක කියනවා ලොකෙට. ඊයේ පෙරේදා මම දැනගත්තේ උන්නැහේ හඳුනාගෙන තියෙනවා කියල එළුවන්ගේ ඇට අවශේෂ මේ යකඩ ආශ්‍රයෙන්. එළුවා කියන්නේ හීලා කරපු සතෙක්. ගිය අවුරුද්දට කළින් අවුරුද්දේ ආචාර්ය නිමල් පෙරේරා මහත්තයාගේ ප්‍රධානත්වයෙන් සිදුකළ කැනීමෙන් තවත් එළුවෙකුගේ ඇටකැබලි වගයක් ලැබුණ. එකෙන් පෙනෙන්නේ ක්‍රිස්තු පූර්ව 1,800 වන විට මෙතන යකඩ පාවිච්චිය නොතිබුණත් අපිට ජේන විදිහට ලෝකඩ පාවිච්චිය තිබිල තියෙනවා. හීලෑ කරන ලද සතුන් ඇති කරල තියෙනවා. ඒ කියන්නේ නවශිලා යුගයට කිට්ටු කරල තියෙන්නේ. දැන් ඔන්න ඔතන වෙනසක් ඇති වුණා.

දැන් ප්‍රශ්නේ තිබුනේ හරි ක්‍රිස්තු පූර්ව 1,800 දී එක්තරා පරිවර්තනයක් තිබුණා තනිකර ශිලා යුගයේ ඉදන් ලෝකඩ යුගයට, ලෝකඩ යුගයේ ඉදන් දැන් ක්‍රිස්තු පූර්ව 900ටත් 1,000ත් අතරේ මොකක්ද සිදුවුනේ කියල. ඒ කියන්නේ යකඩ යුගයටත් අතර මොකක්ද සිදුවුනේ කියල. ඒ පරිවර්තනය ගැන ලොකු හිඩැසක් තිබුනා. එතෙන්ට තමයි මහාචාර්ය සෝමදේව මහත්තයාගේ මේ පර්යේෂණ මාලාව හරියන්නේ. ගැලපෙන්නේ. මුන්නැහැගේ මේ පර්යේෂණ මාලාවෙන් ඒ හිඩැස වහළ තියෙනව දැන්. ඒකයි ඉතාමත් වැදගත්.

අපේ ලෙන්වල, ලෙන් පර්යේෂණවල ප්‍රශ්නයක් මතුවුනා. ඒ කියන්නේ උඩ මට්ටම් සේරම ඉවත් කරල තියෙනවා. එක්කො




උත්සවයට සහභාගි පිරිසෙන් කොටසක්



උඩරංචමඩම පූර්ව ඓතිහාසික ජනාවාසයෙන් හමු වූ ශෛලීගත ගව රුවක් නිරූපිත ටෙරාකොටා මූර්තියක් (ක්‍රිස්තු පූර්ව 1125)

පොහොරවලට අරන්. නැත්නම් පන්සල් හදන්න. ඉතිං අර පරිවර්තනය වන පස් තට්ටු සේරම දැන් හොයාගන්න නෑ. සමහර ලෙන්වල උදාහරණයක් වශයෙන් කිතුල්ගල බෙලිලෙන වගේ ලෙන්වල ඒ උඩපස්තට්ටුවල කවලං වෙලා තියෙනවා වළං කැබලි. අළුපාට වළං කැබලි. පැරණි වළං කැබලි කවළං වෙලා තියෙනවා. හැබැයි අපිට කාලනිර්ණය කරන්න විදිහකුත් නෑ. කොයි සංස්කෘතියකින් ඇවිත් තියෙනවද කියල කියන්න විදිහකුත් නෑ. කවලං නිසා. හැබැයි මහාචාර්ය සෝමදේවගේ මේ පර්යේෂණ මාලාවේ පැහැදිළි ව අපිට පෙන්නලා දීල තියෙනවා මෙන්න මේ විදිහට සොහොන් සම්ප්‍රදායක් තිබුණ. මේ මැටි සොහොන්වල මිනි පුළුස්සලා ඒව වළලල දාල තියෙන විදිහ. ඒ සම්ප්‍රදාය මතු කරල දුන්න. කියන විදිහට හල්දුම්මුල්ලේ ක්‍රිස්තු පූර්ව 1,750ට කාලනිර්ණය කරල තියෙනවා. 1,250ට රංචමඩම තියෙනවා. උන්නැහේ මට කීවා අද පෙන්නුවේ නැති වුනාට ක්‍රිස්තු පූර්ව 600 වෙනකම් තියෙනව රංචමඩමේ. විශාල කාල පරිච්ඡේදයකට අයිති සොහොන් තියෙනවා රංචමඩමේ. ඊ ගාවට ඉබ්බන්කටුවේ තියෙනවා ඒ වගේම සොහොනක්. ක්‍රිස්තු පූර්ව 450ට. රුවන්වැල්ලේ කැනීමක් කරල තියෙනවා මහාචාර්ය ගාමිණී අදිකාරි මහත්මයා. ආය ආචාර්ය නිමල් පෙරේරා මහත්තයා කලඹටුවාවේ කැනීමක් කරල තියෙනවා. නිට්ටඹුව කිට්ටුව. දෙකම ක්‍රිස්තු පූර්ව එකසිය ගණන්වලටයි දෙසිය ගණන්වලටයි වැටෙන්නේ. මේ මැටි සොහොන් සම්ප්‍රදාය අවුරුදු 1,500ක් විතර වෙනවා



උඩවළව සංස්කෘතියේ ශිලා මෙවළම් - මෙය බලංගොඩ උල් ආයුධය නමින් හඳුන්වන විශේෂ ගල් ආයුධයි. (ක්‍රිස්තු පූර්ව 1,750- ක්‍රිස්තු පූර්ව 1,125)

දැන්. මහ පුදුම වැඩක් මේ. අනික් එක අපට කළින් මගේ පියතුමා ආචාර්ය පී. ඊ. පී. දැරණියගල විස්තර කරල තියෙනවා මාතර කිට්ටුව මේ විදිහේ සොහානක්. ආය ගම්පහ කිට්ටුව මේ ආකාරයේ සොහොනක් ස්පොලියා සෙයිලනිකා සඟරාවේ පළ කරල තියෙනවා. රට පුරාම තිබිලත් තියෙනවා. නමුත් සොහොන් සම්ප්‍රදාය විතරක් නෙවෙයි. මහාචාර්ය සෝමදේව පෙන්නුවා වාගේ මේ සොහොන්වල යකඩ භාවිතයත් තිබිල තියෙනවා. යකඩ තාක්ෂණය ආරම්භ වෙලා තිබුණ බවට පැහැදිළි සාදක තිබෙනවා. රංචමඩම සොහොනට මම එක දවසයි ගියේ බලන්න. මුන්නැහේ මට පෙන්නුවා අඩිය දිහා බැලුවහම කළුගල තියෙන්නේ අඩියේ. කපල තියෙනවා කළුගල් වල. මම උන්නැහේට කිවුව මේකනම් කපන්න බැහැ යකඩ ආයුධ නැතුව කියල. කිව්ව වාගෙම යකඩ ආයුධ හම්බුනා. ඇත්තටම මම හිතුවේ මේක ඕනනම් ක්‍රිස්තු පූර්ව 2වන ශතවර්ශයට පමණ වෙයි කියල. හැබැයි ගල් ආයුධ තිබුණ නිසා මම දැනගත්ත ඊට වඩා පැරණියි කියල. හැබැයි බැලින්නම් ඇත්ත යකඩ තාක්ෂණයත් තිබුණා. අනිත් එක දැන් දැනගන්න ඕනේ ලොකේ අනික් රටවල් දිහා බැලුවහම මෑතක දී ඉන්දියාවේ man and environment සඟරාවේ සඳහන් කරල තියෙනවා ඉන්දියාවේ යකඩ පාවිච්චිය පිළිබඳ පත්‍රිකාවක්. ඒකේ සඳහන් කරල තියෙනවා ක්‍රිස්තු පූර්ව 700ටත් 800ටත් අතර සොයාගෙන තියෙනවා කියල හිටං යකඩ භාවිතයේ සාක්ෂි. මේක ඉතාමත් වැදගත්. මේ පළාතට දකුණු ආසියාවට යකඩ තාක්ෂණය ආව කියල කවුරුත් පිළිගන්නේ නෑ ඔච්චර ඈතකදී. එච්චර අතීතයක දී. ඉතාමත් වැදගත්.

තව දුරටත් අපි කියන්න ඕන මේ ආරම්භයක් පමණයි. මේ ග්‍රන්ථය පෙන්නුම් කරල තියෙන මඟ ඉතාමත් ම වැදගත්.

ඔකට ඉංග්‍රීසියෙන් කියන්නේ Working Documentary කියල. අර අපි ලියල තියෙන Prehistory of Sri Lanka පොත වගෙ. එක මඟ පෙන්නුම් ග්‍රන්ථයක් හැර වෙන මොකක්වත් නොවෙයි. ඉදිරියට ඒ ටික ගෙනියන්න ඕන ආචාර්ය නිමල් පෙරේරා ගෙනියනව වාගේ. මහාචාර්ය සෝමදේව මහත්තයාගේ මේ ග්‍රන්තයත් මඟ පෙන්වීම් ග්‍රන්ථයක්. ඒ හැටියට සලකලා ඉදිරියට ගෙනියන්ඩ ඕන.

ඊයෙ මම ඔක කියවකියව ඉන්දැද්දී ප්‍රශ්න කීපයක් මතුවෙනවා. දැන් උදාහරණයක් වශයෙන් උඩරංචමඩමේ වීදුරු පබළු හමු වෙනවා. දැන් ප්‍රශ්නේ අහන්ඩ ඕනේ මේ වීදුරු පබළු තාක්ෂණය ආවේ කවදද කියල. අපි දැනගෙන ඉන්නේ 1120 දී. ඒ කාළේ. ඒ වගේම එවුව හමු වෙලා තියෙනවා අපේ අනුරාධපුරේ කැනීම්වල ක්‍රිස්තු පූර්ව 500 ඉදන් පටන් ගන්න පැතලි අර පැතලි ලාකඩ වාගේ තියෙන පබළු. දැන් පොතේ දාල තියෙන්නේ ඒවා මැටි කියල. ඒව මැටි නෙවෙයි අපි පෙන්නලා දීල තියෙනවා ඒවා තඹ මිශ්‍රිත වීදුරු. දැන් මේකේ අර කුඩා මිලිමීටර් 5කුත් ප්‍රමාණයේ ඒව හම්බ වෙලා තියෙනවා. දැන් වෙන්න පුළුවන් මේ රටේ ඔච්චර දියුණු වීදුරු පබළු තාක්ෂණයක් තිබුණ කියල ඔච්චර ඈතට. මේව ලොකු ප්‍රශ්න. එහෙම තමයි මේ වගේ ප්‍රශ්න මතු කරල තමයි පර්යේෂණ කියන එක ඉදිරියට යන්නේ. සමහරු හිනාවෙනවා ඒක වෙන්ඩ බෑ කියල. දැන් උදාහරණයක් වශයෙන් අපි ජ්‍යාමිතික ක්ෂුද්‍රශිලා මෙවළම් බටදොඹලෙනින් හොයාගන්න කොට අපි මේව මවල කියල. දැන් ලොකේ පිළි අරං තියෙන්නේ. ජ්‍යාමිතික ක්ෂුද්‍රශිලා මෙවළම් දැන් එන්නේ ක්‍රිස්තු පූර්ව 36,000යි ෆා-හියං ලෙනේ. දැන් අපිට හිනා වෙන්නේ නෑ කවුරුවත්. මුළින් කිවුවහම හැමදෙනාම හිනා වෙනවා. ඒකයි මම කියන්නේ මෙම සොයාගැනීමත් ඉදිරියට කවද හරි ඔප්පු වෙයි කියල මගේ බලාපොරොත්තුවක් තියෙනවා. දැන් කවුරු කවුරු



උත්සවයට සහභාගි පිරිසෙන් කොටසක්

හරි පිළිගත්තේ නැතත්.

අවසන් වශයෙන් මම කියන්න සතුටුයි මේ පර්යේෂණ වලට මුල් තැනත් දිය යුතුයි උද්භිත විද්‍යාවට. ඒ කියන්නේ ජීවන රටාව පිළිබඳ අපිට දැනුමක් ලබා ගන්න බෑ පුරා උද්භිද විද්‍යාත්මක පර්යේෂණ නැතිව. ආචාර්ය ප්‍රේමතිලක උන්නැහේගේ සහභාගිත්වයක් නැතිව ඉදිරියට යන්න බෑ. දැන් අපිට ඇඹරුම්ගල් තියෙනවා. දැන් පෙන්නුවනේ රංචමඩමේ එහෙම. දැන් ඔවගේ මොනව ඇඹරුව ද ඒවගේ අර පරාග තියෙනවා. එතකොට පයිටොලිත් කියල තියෙනවා පරාග වර්ගයක්. දැන් ඒවයින් අපිට අල්ල ගන්න පුළුවන් පරිසරය ගැන විතරක් නෙවෙයි කැවේ මොනවද කියල අල්ල ගන්න පුළුවන්. විශේෂයින්ම පයිටොලිත් වලින්. ඒ ටික කෙරෙන්ඩම ඕනේ. දැන් වැදගත් වන උඩරංචමඩමේ වාසස්ථානයක් වන මේ ටික කරන් නැතිව අපේ අදහස් 2න් පංගුවක් විතර අදහස් දුර්වල වෙනවා ඒ පුරාඋද්භිතවිද්‍යා පර්යේෂණ නැතිව. ඒ ටික කෙරෙන්නම ඕනේ. වගා කරාද නැද්ද කියල හිටං අල්ල ගන්න පුළුවන් ඔය මාර්ගයෙන් විතරයි.

අවසන් වශයෙන් මම කියන්න සතුටුයි කෞතුකාගාරයේ ආචාර්ය නන්දා වික්‍රමසිංහ මැතිණියගේ ප්‍රධානත්වයෙන් ස්පෝලියා සෙයිලනිකා සඟරාව පිටවෙලා තියෙනවා. 39 වන කලාපය. ඒකේ තියෙනවා ඇමරිකාවේ ඇරිසෝනා විශ්වවිද්‍යාලයේ කෙනෙක් ලිවුව අපේ බලංගොඩ මානවයාගේ හා වැදි ගෝත්‍රික ජනයාගේ ජාන පිළිබඳව පිටු 139ක පත්‍රිකාවක්. ඒක පත්‍රිකාවක් නෙවෙයි පොතක්. සියයට 99ක්ම ඒ පොත තියෙන්නේ ඒ සඟරාවේ. ඒකේ කොටසක් තියෙනවා දන්ත විශ්ලේශනය. ඒ කියන්නේ අපේ ලේ උරුමය පිළිබඳ ව ජාන උරුමය පිළිබඳ කතාකරන්නේ දන්ත විශ්ලේශන වලින්. ඩී. එන්. ඒ. වාගෙම වැදගත් ක්‍රමයක්. ඒ ක්‍රමවෙදය අනුව කිසි ප්‍රශ්නයක් නෑ. ඒකේ තියෙනවා උතුරු ඉන්දියාවේ ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ පුද්ගලයොනුයි මුළු උතුරු ඉන්දියාවෙම ඉන්න මානව වර්ග සංසන්දනය කෙරුවහම ලංකාවේ මානවයා සමඟත් සංසන්දනය කෙරුවහම ඉන්දු නිම්න ශිෂ්චාරයේ ඒ මානවයන්ට කිට්ටුම අය දැන් කාලේ ඉන්නේ අපේ රටේ. සිංහලයොයි නැගෙනහිර ඉන්දියාවේ ඔරිස්සාවේ ජනතාවයි කියල ඔන්න තියෙනවා. මං කියන දෙයක් නෙවෙයි ඔය. පොඩ්ඩක් හිතට ගන්න මේකේ තේරුම මොකක්ද කියල. ඔය මහාචාර්ය සොමදේව මහත්තය අද කීව ඉන්දු නිම්ණ ශිෂ්ටාචාරය කෙළවර වන විට 1,750 වන විට මෙන්න මෙහේ යකඩ මතු වෙලා තියෙනවා. ඉන්දියාවෙත් තියෙනවා කියල කියන්නේ බටහිර ඉන්දියාවේ. මම එතනින් එහාට කියන්න යන්නෙත් නෑ. එක අදහස. ඕක හුගක් දුරට ගෙනියන්න පුළුවන්. ඉස්සරලම බලන්න ඕනේ ඒ ආචාර්යතුමිය ලිවුව එක හරිද වැරදිද කියල. ඒ ක්‍රමවේදය හරිද වැරදිද කියල බලන්න ඕනේ. අනික් පැත්තෙන් පුරාවිද්‍යාව පැත්තෙන් අපි බලන්න ඕනේ කරන්න පුළුවන උපන්‍යාසයක්. ආචාර්යතුමා කියනවා වගේ මේක යෝජනාවක්. විද්‍යාත්මක වශයෙන් අපිට ඔප්පු කරන්න පුළුවන්ද බැරිද කියල අපි බලන්න ඕනේ. ඔන්න ඕව තමයි අපේ ප්‍රශ්න. ඒ කියන්නේ පුළුල් දර්ශනයක් තියෙන්ඩ ඕනේ මේ විදහේ දෙයකට බහින්න නම්. ඉස්සර වාගේ කොහෙට හරි ගිහිං වලක් හාරාගෙන දත්ත හොයන එක නෙවෙයි කාරණය. ප්‍රශ්න මාලාවක් හදාගන්ඩ. ඒවට උත්තර දීමට සැලසුම් කරාන අහවල් තැනට අහවල් විදිහට වැඩකරන්න පුළුවන කියල සැලැස්මක් ඇති වැඩ කරන එකයි ඇත්තේ. ඕනෑම ශාස්ත්‍රීය කටයුත්තක් කරන්නේ එහෙමනේ. පුරාවිද්‍යාව එකෙන් පිට පනින්න බෑ. මේ විදහට ප්‍රශ්න මාලාවක් හදල ඒ ප්‍රශ්න විසදන්න සැලැස්මක් හදල උපරිම දායකත්වය දාල තමයි පුරාවිද්‍යාව ඉදිරියට යන්න ඕනේ.

අනික් එක මම කියන්න ඕනේ ඉස්සර කාලේ උදාහරණයක් වශයෙන් මම වැඩකරන කාලේ 1966 ඉදං තනියෙන් මම ඇදගෙන ගියේ. ඉන්ග්‍රීසියෙන් කිවුවොත් solo effort කියල. මට සහයට කවුරුවත් හිටියේ නෑ. දැන් එහෙම නෙවෙයි. මේ ආයතනයෙත් සෑහෙන කට්ටියක් ඉන්නවා. උදව්වට වෙනත් ආයතන තියෙනවා විශ්වවිද්‍යාල තියෙනවා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තියෙනවා. මේක කණ්ඩායම් වශයෙන් කළයුතු දෙයක්. විනිවිද භාවයක් තියෙන්න ඕනේ. ඒ වගේම විශේෂඥයොත් ඉන්න ඕනේ වෙන වෙන අංශවලට. මේ ආයතනයටත් වෙන වෙන ආයතනවල විශේෂඥයන්ගේ දැනුමත් ලබාගත යුතුයි. විනිවිධ භාවය ඉතාමත් ම වැදගත්. ඉතිං මම යෝජනා කරන්නේ මේ මූලික ග්‍රන්ථය මේ පර්යේෂණ මාලාව ඉදිරියට ගෙනියන්න මහාචාර්ය සෝමදේව මහත්තය ඉස්සර වෙලා කඩාගෙන බිදගෙන ගියදෙන්. හැබැයි තව කට්ටියක් ඇත්තටම මේක සහතික කරගෙන පිටිපස්සෙන් එන්න ඕනේ. එහෙම නැතිව ඉදිරියට ශාස්ත්‍රීය පුරාවිද්‍යාව ගෙනියන්න බෑ. දැන් දෙන්නෙක් ඉන්නවා මේ ආයතනයේ මහාචාර්ය සොමදේව එක පැත්තකින් ආචාර්ය ප්‍රේමතිලක අනික් පැත්තෙන්. දෙන්නම තනිකර අලුත් මත ඉදිරිපත් කරල තියෙන්නේ. සෑහෙන කට්ටියක් පිළිගන්නේ එකක් නෑ මේ ඇත්තක් කියල. මං නම් පිළිගන්නවා.

ආචාර්ය ප්‍රේමතිලක මහත්තයාගේ ආචාර්ය උපාධියේ පරීක්ෂණය තිබුනේ ස්විඩනයේ. මම ගිහිං හිටන් එතන අනික් මහාචාරයවරු කියන ඒව මම අහගෙන හිටිය. උද්භිද විශේෂඥයොත් එතන හිටිය. මම ඇහුව මගේ විෂය නෙවෙයි මේ පරාග විශ්ලේශනය. තමුන් මොනවද මේ ගැන කියන්නේ කියල. ඒ ඇත්තෝ කිවුව කිසියම්ම සැකයක් නෑ, ආචාර්ය ප්‍රේමතිලක කියන ඒව හරියි කියල හොර්ටන් තැන්නේ පරාග ගැන. මේහාට ආපුවහම සමහර මිනිස්සු හිනැහෙනවා. ඉතිං ඕකට තව කට්ටියක් රදවගන්න ඕනේ. ඒ කියන්නේ කන්ඩායමක් ඉන්න ඕනේ. මහාචාර්ය සෝමදේවටත් මම කියන්නේ ඔච්චරමයි. කණ්ඩායමක සම්බන්ධ කරගන්න ඕනේ නැත්නම් කවුරුහරි කියයි මේ කරන්නේ බොරුවක් කියල. මං දන්නවනේ මට කොච්චර දොස් කීව ද. ඒකක් අර ජ්‍යාමිතික ක්ෂුද්‍ර මෙවළම් හමු වුණු වෙලාවේ ඒක කවුරුවත් පිළිගත්තේ නෑ. ඊගාවට අර ක්‍රිස්තු පූර්ව 500ට කළින් අක්ෂර භාවිතය තිබුණ කිවුව වෙලාවේ. කවුරුවත් පිළිගත්තේ නෑ. ඔහොම දෙවල් වලින් මම බැටකාල තියෙනවා. ඒකයි මම උපදෙස් දෙන්නේ මේ මතු පරම්පරාවට තවත් කට්ටියක් විනිවිදව සම්බන්ධ කරාගන්න කියල මේ ව්‍යාපෘතිවලට. ඔයිට එහාටනම් ඉතිං මට කියන්න දෙයක් නෑ.

ස්තූතියි ඇහුම්කම් දුන්නට.

සටහන :
චන්දිම අඹන්වල



හල්දුම්මුල්ල සුසාන භූමියෙන් හමු වූ යකඩ සහිත ස්වභාවික ගල් (ඇල්මන්ඩීන්) (ක්‍රිස්තු පූර්ව 1,750)

## ජාතික පුරාවිද්‍යා සමුළුව කල් යයි

ජූලි මස 7 හා 8 දිනයන්හි දී කොළඹ දී පැවැත්වීමට නියමිතව පැවැති ජාතික පුරාවිද්‍යා සමුළුව නොවැලැක්විය හැකි හේතුවක් නිසා කල් දැමීමට සිදු වී ඇති බව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිවේදනය කර ඇත. සමුළුව ජූලි මාසයේ ම 19 හා 20 යන දෙදින තුළ කොළඹ 7 ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ශ්‍රවනාගාරයේ දී හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වීමට ද සංවිධානය කර ඇත. පසුගිය වසර ගණනාවක් තිස්සේ ජාතික පුරාවිද්‍යා සතියට සමගාමීව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සංවිධානය කරන ලද මෙම සමුළුව කීප ආකාරයකින්ම ලංකාවේ ජාතික උරුමය රැකගැනීම සම්බන්ධයෙන් වැදගත් වී ඇත.

මෙවර සමුළුව තුළ දී පසුගිය වසරක කාලයක් තුළ ලක්දිව පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ ක්ෂේත්‍රයේ සිදු වූ පර්යේෂණ හා අධ්‍යයන ඇතුළු විවිධ ක්‍රියාකාරකම් පිළිබඳ ව පත්‍රිකා 60කට අධික ප්‍රමාණයක් විවිධ විද්වතුන් විසින් ඉදිරිපත් කිරීමට නියමිත ය.

# පසුගිය සියවසේ මෙරට බිහි වූ විශිෂ්ට විද්වතෙක්

කැළුම් නලින්ද මනමේන්ද්‍ර-ආරච්චි
කළමනාකාර භාරකරු, වනජීවී උරුම භාරය

ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාව පිළිබඳව බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ලක්දිව එක් විශ්වවිද්‍යාලයක පුරාවිද්‍යා විශේෂවේදී උපාධිය හදාරණ විසිපස්දෙනෙකුගෙන් යුතු තෙවන වසර ශිෂ්‍ය කණ්ඩායමක දේශන මාලාවේ ප්‍රථම දේශනය ආරම්භ කරමින් මා ඔවුන් වෙත ප්‍රශ්නයක් යොමු කළෙමි. ඒ 'ආචාර්ය පෝල් එඩ්වඩ් පීරිස් දැරණියගල යනු කවුරුද? යන්නයි. ඔවුන් එකිනෙකාගේ මුහුණු දෙස බැලූ නමුත් මාගේ ප්‍රශ්නයට පිළිතුරු නොලැබුණි. එයින් පසු මා 'ඔබ මහාචාර්ය පරණවිතාන හඳුනනවාද? යනුවෙන් ඔවුන් වෙත දෙවන ප්‍රශ්නයක් යොමු කළෙමි. සිසුන් සියලු දෙනාගෙන්ම ඊට නිවැරදි පිළිතුරු ලැබුණි. පරණවිතාන යනු විශිෂ්ට පුරාවිද්‍යාඥයෙකු, අභිලේඛන පිළිබඳ විශේෂඥයෙකු මෙන්ම ඉතිහාසඥයෙකු ද වූ බව ඔවුහු පැවසූහ. සරලව දක්වතොත් මා විසින් මෙම ලිපිය ලිවීමට පාදක වූ විශේෂ හේතුව වූයේ ඉහත විස්තර කළ මේ සිදුවීමය. (මහාචාර්ය සෙනරත් පරණවිතානයන්ගේ ජන්ම දිනය නිමිත්තෙන් සෑම වසරකම පාහේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර අධ්‍යක්ෂවරයෙකු වූ සිරිසමන් විජේතුංග මහතා පරණවිතානයන් පිළිබඳ ලිපි කිහිපයක්ම පුවත්පත්වල පළ කරමින් ජනතාව තුළ එතුමා පිළිබඳ වන මතකය අලුත් කිරීමට දරනා උත්සාහය වෙනුවෙන් අප විජේතුංග මහතාට ස්තුති කළ යුතුය.) පසුගිය සියවසේ අපරට බිහි වූ ශ්‍රේෂ්ටතම විද්වතෙක් වූ පී.ඊ.පී. දැරණියගල පිළිබඳ දැනුමැත්තන් අද ඇත්තේ අතලොස්සකි. එබැවින් ශ්‍රී ලංකාවට විශාල කීර්තියක් මෙන්ම සත්ත්ව විද්‍යාව, පාෂාණීභූත විද්‍යාව හා ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාව උදෙසා අතිමහත් සේවයක් කළ දැරණියගල මහතා පිළිබඳ ඔබට සුළු විස්තරයක් ඉදිරිපත් කිරීම මේ ලිපියේ මූලික අරමුණ වේ.

මෙම ලිපියට අදාළව එතුමා පිළිබඳව සුළු විස්තරයක් පමණක් ඉදිරිපත් කිරීමට මා උත්සාහ කළ නමුදු ඔහු සම්බන්ධව සුවිසල් ග්‍රන්ථයක් පළ කිරීමට තරම් කරුණු මේ වන විට මා සතුව ඇත. 1980 දී මා හට මුණගැසුණු පුංචි බණ්ඩා කරුණාරත්න සහ 1985 දී මුණගැසුණු පී.බී. සරනේලිස් යන නැසීගිය මහතුන් දෙපළ

මෙම ලිපිය සම්පාදනය කිරීමේ දී ප්‍රථමයෙන් හඳුන්වා දීමට කැමැත්තක් දක්වනුයේ ඔවුන් දැරණියගල මහතා පිළිබඳව බොහෝ පෞද්ගලික කරුණුකාරණා මා වෙත ලබාදුන් නිසාවෙනි. කරුණාරත්න මහතා කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කීට විද්‍යාඥයෙකු ලෙස සේවය කළ අතර ඔහු ආචාර්ය පී.ඊ.පී. දැරණියගල සහ ආචාර්ය සිරාන් දැරණියගල සමඟ සමීප ඇසුරක් දක්වමින් ඔවුන් සමඟ පර්යේෂණවල නිරත වූ ස්වභාව විද්‍යාඥයෙකි. සරනේලිස් මහතා පී.ඊ.පී. දැරණියගල මහතා සමඟ ඔහුගේ කැනීම්, ගවේශන හා සතුන් එකතු කිරීමේ චාරිකාවලට සහභාගී වෙමින් එතුමා සමඟ සමීප ඇසුරක් පැවැත් වූ අයෙකු විය. මෙම දෙපළ විසින් පී.ඊ.පී. දැරණියගල පිළිබඳව බොහෝ කරුණු මා වෙත යොමු කළ ද මෙහි අඩංගුව ඇත්තේ එයින් අල්පයකි.



පෝල් එඩ්වඩ් පීරිස් දැරණියගල

ක්‍රිස්තු වර්ෂ 1,900 මැයි 8 වන දින පෝල් එඩ්වඩ් පීරිස් දැරණියගල මහතා උපත ලැබීය. එවකට මෙරට විසූ ධනවත්, උගත් හා බලවත් පවුලක සාමාජිකයෙකු ලෙස උපත ලැබූ දැරණියගලගේ පියා වූයේ සර් පෝල් එඩ්වඩ් පීරිස් ය. මව වූයේ හිල්ඩා ඔබේසේකර මැතිණියයි. සර් පෝල් පීරිස් භාෂාව හා ඉතිහාසය පිළිබඳ පුළුල් දැනුමකින් හෙබි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර සමයේ කැපී පෙනෙන සිවිල් නිලධාරියෙකු මෙන්ම එවකට පැවති පාලනයේ නීතිය පිළිබඳ විශාරදයෙකු ද විය. ළාබාල දැරණියගල තම මුල්ම අධ්‍යාපනය රජයේ පුහුණු විද්‍යාලයෙන් ද (Government Training Collage) ඉන් අනතුරුව මට්ටක්කුලියේ පිහිටි (පසු කලෙක ගල්කිස්සේ ස්ථාපිත කරන ලද) සාන්ත තෝමස් කොලීජියෙන් ද හදාරණ ලදී. මෙරට තුළ දී මූලික අධ්‍යාපන වැඩකටයුතු නිමවා කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට ඇතුළුවීම අතරතුර පැවති කාලයේ දී කොළඹ වෛද්‍ය විද්‍යාලයට ඇතුළු වී කායච්ඡේදන විද්‍යාව (Anatomy) හැදෑරීය. 1919 දී සත්ත්ව විද්‍යාව හැදෑරීමට කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයටත්, ඉන් අනතුරුව හාවර්ඩ් විශ්වවිද්‍යාලයටත් ඇතුළු විය. හාවර්ඩ් විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධිය නිමවීමෙන් අනතුරුව 1925 දී ශ්‍රී ලංකාවට පැමිණ කෞතුකාගාර සහ ධීවර දෙපාර්තමේන්තුවට සම්බන්ධ විය. ඉන් අනතුරුව 1937 දී සමුද්‍ර ජීවවිද්‍යාඥයෙකු ලෙස කොළඹ කෞතුකාගාරයේ වැඩබලන අධ්‍යක්ෂ තනතුරක් ලැබිණි. තිස්නව වියැති පී.ඊ.පී. දැරණියගල වසර 1939 අප්‍රේල් මස විසිහත් වන දින කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් විය. මෙතුමා කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රථම ශ්‍රී ලාංකික අධ්‍යක්ෂවරයා විය. 1963 ජූලි මාසයේ එම තනතුරින් විශ්‍රාම යන තෙක්ම



කුරුවිට ආසන්නයේ බටදොඹ ලෙන




ආචාර්ය පී.ඊ.පී. දැරණියගල මහතා



ප්‍රිණි මොලමුරේ මැතිණිය

කෞතුකාගාර අධ්‍යක්ෂ ධුරය දරමින් පර්යේෂණ හා ප්‍රකාශන ගණනාවක්ම ලොව හමුවේ තබමින් එම දෙපාර්තමේන්තුවට ජාත්‍යන්තර මට්ටමින් කීර්තියක් ලබා දුන්නේය. වසර 1934 ජූනි මස 28 වන දින හෙතෙම දහනව වියැති ප්‍රිණි මොලමුරේ මෙනෙවිය සමග විවාහ ගිවිස ගත්තේය. මෙම දෙපළ පුතුන් සිව්දෙනෙකුගේ දෙමාපියන් වූහ. ඒ අර්ජුන්, රනිල්, සිරාන් සහ ඉසාන්ත් ය. මේ අතරින් ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාව ප්‍රගුණ කරමින් පියාගේ අඩිපාරේ ගමන් ගත්තේ සිරාන් පුතුය.

'ලොවින් එකෙක් එක් දෙයකට වෙයි සමත' යන කියමන අරුත් සුන් කරමින් දැරණියගල තම ජීවිත කාලය තුළ විෂය ක්ෂේත්‍ර ගණනාවකම කෙළ පැමිණීමට තරම් දක්ෂයෙකු විය. එතුමා තම ජීවිත කාලය තුළ පළ කරන ලද ශාස්ත්‍රීය ලිපි, ග්‍රන්ථ, පරිපාලන වාර්තා ආදිය හාරසියයක් පමණ වේ. මත්ස්‍ය විද්‍යාව, උරග හා උභයජීවී විද්‍යාව, පක්ෂි විද්‍යාව, ක්ෂීරපායී විද්‍යාව, පාෂාණීභූත විද්‍යාව ආදී ස්වභාව විද්‍යා විෂයන් ද ඊට අමතරව ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාව, පැරණි බිතුසිතුවම්, දැව කැටයම්, ඇත්දළ කැටයම්, පැරණි සටන් ක්‍රමෝපායන්, කුකුළන් කෙටවීම ඇතුළු අනෙකුත් සතුන් පොරයට යෙදවීම, පැරණි ආයුධ ඇතුළු පුරාවස්තූන් ආදී ක්ෂේත්‍ර ගණනාවක්ම සම්බන්ධව පර්යේෂණවල නියැලෙමින් ශාස්ත්‍රීය ලිපි ගණනාවක් පළකොට ඇත. ඔහුගේ ශාස්ත්‍රීය ලිපි 1929 සිට 1975 තෙක්ම අඛණ්ඩව පළ විය. මීට අමතරව තෙල් සායම් හා දිය සායම් චිත්‍ර නිර්මාණය මෙන්ම, දැව කැටයම් නිර්මාණ සිදුකිරීම සඳහා ද දැරණියගල මහතා උපන් හපනෙකි. ඔහු විසින් රචිත ශාස්ත්‍රීය ලිපි හා ග්‍රන්ථ සඳහා අවශ්‍ය වූ බොහෝ චිත්‍ර අඳින ලද්දේ ඔහු විසින්මය. එම චිත්‍ර නිර්මාණ අතර ප්‍රකාශයට පත් නොකළ චිත්‍ර 500කට වැඩි සංඛ්‍යාවක් ආචාර්ය සිරාන් දැරණියගල මහතා සතුව ඇත. ඒ අතරින් බොහෝමයක් පිටපත් කරගැනීමට මෙම කතුවරයා හැකි විය. ඒවා අතර මසුන්, සර්පයින්, කටුස්සන්, හූනන්, පක්ෂීන් ආදී සතුන් ඇඳ ඇත්තේ පරිමාණ චිත්‍ර ලෙසය. මසුන්ගේ, සර්පයින්ගේ, කටුස්සන්ගේ ශරීරයේ වූ කොරළ සංඛ්‍යාව, පිහිටීම ආදිය මෙන්ම ඒ ඒ අවයවල පිහිටීම ද ඉතා නිවැරදි ව




පී.ඊ.පී. දැරණියගල මහතාගේ ආචාර්ය උපාධි නිබන්ධය

දක්වා ඇත. මේ නිසා ඒ සත්ත්ව රූප වැදගත් වනුයේ හුදෙක් චිත්‍ර ලෙසින් පමණක්ම නොවේ. පී.ඊ.පී. දැරණියගල විසින් දිය සායම් මාධ්‍යයෙන් අඳින ලද පක්ෂි රූප රැසක් වුව ද ඒවා මේ වන තෙක් පළකොට නොමැත. ඒ අතර රාජාලියන්, උකුස්සන් හා කෑදැත්තන් වේ. එතුමා කෞතුකාගාර සේවයෙන් විශ්‍රාම ගැනීමට ආසන්න කාලයේ ක්ෂීරපායීන් පිළිබඳව ග්‍රන්ථයක් සම්පාදනය කරමින් සිටි අතර ඒ සඳහා නිර්මාණය කරන ලද රූප රැසකි. නමුත් අභාග්‍යයකට මෙන් ඒ ග්‍රන්ථය එළිදැක්වීමට ඔහුට නොහැකි විය. මසුන්, සර්පයන්, කටුස්සන්, හූනන් හා ඉදිබුවන් ඇතුළත් වර්ණ රූප සහිත ග්‍රන්ථ තුනක් පළ කෙරිණි. A coloured atlas of some vertebrates from Ceylon යනුවෙන් වෙළුම් තුනක් ලෙස ඉංග්‍රීසි භාෂාවෙන් ඉතා ශාස්ත්‍රීයව ලියා ඇති මේ ග්‍රන්ථ ත්‍රිත්වය 1950 දශකයේ දී කෞතුකාගාර ප්‍රකාශන ලෙස එළිදැක්විණි. මීට අමතරව කැස්බෑවුන් හා උරගුන් පිළිබඳව ද, අලින් පිළිබදව ද, ප්ලයිස්ටොසීන අවධිය පිළිබඳව ද ශාස්ත්‍රීය ග්‍රන්ථ කිහිපයක්ම එළි දක්වා ඇත. අලින් පිළිබඳව ග්‍රන්ථයක් ඇතුළු ශාස්ත්‍රීය ලිපි ගණනාවක්ම එළි දක්වන ලද දැරණියගල මේ සත්ත්වයා කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වා ඇති බව පෙනේ.

කෙනත් පේජ් ඕක්ලි නම් පුරාවිද්‍යාඥයා 1980 දී සම්පාදනය කළ පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රීය ලිපියක පී.ඊ.පී. දැරණියගල මහතා විසින් රුක්අත්තන දැවයෙන් කළ ශ්‍රී ලංකාවේ ආදි මානවයා හෙවත් බලංගොඩ මානවයාගේ කැටයමක රේඛා චිත්‍රයක් ඇතුළත් කොට තිබුණි. මේ විශේෂ කැටයම ලන්ඩනයේ පිහිටි බ්‍රිතාන්‍ය ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කොට ඇති බව එහි වැඩිදුරටත් සඳහන් විය. 1996 දී සත්ත්වවිද්‍යා පර්යේෂණ කටයුතු සඳහා මා ප්‍රථම වතාවට බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට ගිය මොහොතේ එම දැව කැටයම මා නෙත ගැටිණි. එවකට ඒ කැටයම බාරව සිටි මහත්මියට කල්තියාම ලිපි යොමු කොට එය අධ්‍යයනය කිරීමට අවසර ඉල්ලා තිබුණි. එහි දී එතුමිය ඒ කැටයම තැන්පත් කොට ඇති බ්‍රිතාන්‍ය ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ පිහිටි විශේෂ කුටියට මා කැඳවාගෙන ගියාය. ලොව නන් දෙසින් පැමිණි විශේෂ කලාකෘති මෙම දැවැන්ත ශාලාවේ තැන්පත් කොට තිබෙනු මට දැකගත හැකි විය. විස්මය උපදවමින් ඒ කුටියේ මේසයක් මත තැන්පත් කොට තිබූ පී.ඊ.පී. දැරණියගල මහතාගේ නිර්මාණයක් වූ බලංගොඩ මානව කැටයම දැකගත හැකිවිය. අඩියක් පමණ උසැති මේ කැටයමින් නිරූපණය වනුයේ බලංගොඩ මානවයාගේ උඩුකයයි. (පිටකවරයේ එලකය බලන්න) මිල කළ නොහැකි ලොව වටිනා චිත්‍ර හා දුර්ලභ ගණයේ කලා කෘතිවලින් පිරී තිබුණු මේ කුටිය විදුලි බුබුළුවලින් ආලෝකවත් කර නොතිබුණේ චිත්‍රවල වර්ණයන් තවදුරටත් සුරක්ෂිතව තබා ගැනීමට අවශ්‍ය වන නිසාය. මේ කැටයම අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ඡායාරූප ලබා ගැනීමට අවශ්‍ය යැයි එතුමියට දැන් වූ අතර කැමරාවේ ක්ෂණික විදුලි බුබුළ දැල්වීමට ඇයගෙන් අවසර නොලැබිණ. කෙසේ වුව ද විශේෂ අවසරයක් මත කැමරා ආලෝකය සහිතව එක් ඡායාරූපයක් පමණක් ගැනීමට අවසර ලැබිණි. මේ කැටයම සත්‍ය ලෙසම උසස් හා අග්‍රගන්‍ය නිර්මාණයක් බව මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි. මෙයට අමතරව එතුමා විසින් නෙළන ලද තවත් කැටයම් කිහිපයක් ශ්‍රී ලංකාවේ ඇත. ඒවා නම් ප්ලයිස්ටොසීනයේ ජීවත්ව සිට වඳ වී ගිය හස්තියෙකුගේ රුවක්, අප්‍රිකාවේ ජීවත්ව සිට වඳව ගිය හිපොපොටේමසෙකුගේ හිසක්, පොරකුකුළෙකු ආදිය වේ. ඒ කැටයම් ආචාර්ය සිරාන් දැරණියගල සතුව කුරුවිට එක්නැලිගොඩ වලව්වේ ඇත.




දැරණියල විද්වතුනගේ වාසස්ථානය වූ කුරුවිට එක්නැලිගොඩ වලව්ව



ආචාර්ය සිරාන් දැරණියගල මහතා

පී.ඊ.පී. දැරණියගල මහතාගේ චිත්‍ර හා කැටයම් රැසක හිමිකරුව ඇත්තේ ආචාර්ය සිරාන් දැරණියගලය. ඔහු ඒ කෘති සුරක්ෂිතව තබාගැනීම පිළිබඳව අප ඒ මහතාට ස්තූතිවන්ත විය යුතුය.

ශ්‍රී ලංකාවේ පාෂාණීභූත අධ්‍යයනය ප්‍රථමයෙන්ම ආරම්භ කරන ලද්දේ පී.ඊ.පී. දැරණියගල මහතා විසිනි. ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ වූ තබ්බෝව, ආඬිගම හා පල්ලම පිහිටි වසර මිලියන 100ක් පමණ පැරණි ජුරාසික යුගයට අයත් පර්ණාංග ආදී ශාක ෆොසිලත්, යාපන අර්ධද්වීපයේ



*(ඉහළ) Homo sinhaleyus* Deraniyagala මානවයාගේ උපරි අක්ෂි කූප කුහරය



*(පහළ) Homopithecus sinhaleyus* Deraniyagala මානවයාගේ කෘන්තක දත (ඡායා රූප. කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

හා ගිනිකොනදිග ශ්‍රී ලංකාවේ වූ මිනිහාගල්කන්දේ පිහිටි, වසර මිලියන 25-5ත් අතර පිහිටි මයෝසීන යුගයට අයත් සත්ත්ව ෆොසිලත්, රත්නපුර කේන්ද්‍ර කොට ගත් ඒ ආශ්‍රිත කලාපයේ දියළු තැන්පතු අතරේ මැණික් බොරැල්ලේ හමුවන වසර මිලියන 2 - වසර 10,000 කාලයට අයත් ප්ලයිස්ටොසීන අවධියේ ජීවත් වූ විශාල ක්ෂීරපායී සතුන්ගේ ෆොසිලත් එතුමාගේ පර්යේෂණ සඳහා බඳුන් විය. මයෝසීන යුගයට අයත් සමුද්‍ර ෆොසිල අතර එකයිනොඩොමෙටාවන්, මොලුස්කාවන්, කකුළුවන් ආදී අපෘෂ්ඨවංශී සතුන් ද, කාටිලේජීය මසුන්, අස්ථික මසුන්, කැස්බෑවුන්, ඉබ්බන්, තල්මසුන්, ඩොල්ෆින් හා මුහුදු ඌරන් ආදී සතුන් පිළිබඳව ද දැරණියගල පර්යේෂණ සිදුකොට ඇත. මේ පුරාණ සතුන් අතරින් නව විශේෂ කිහිපයක් ද නම්කිරීමට හෙතෙම සමත් විය.

ඔහු ශාස්ත්‍රීය ලිපි බොහෝ ගණනක් ලියා පළකොට ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්ලයිස්ටොසීන අවධියට අයත් විශාල ක්ෂීරපායී සතුන් පිළිබඳවය. ඉන්දියාවේ නර්මදා හා ෂිවාලික් ෆොසිල තැන්පතුවලට සමීප ඥාතීත්වයක් දක්වන ශ්‍රී ලංකාවේ ප්ලයිස්ටොසීන ෆොසිල නියෝජනය කරන සත්ත්ව කාණ්ඩය 'රත්නපුර සත්ත්ව සන්තතිය' යනුවෙන් එතුමා විසින් නම් කෙරිණි. ශ්‍රී ලංකාවේ රත්නපුර සන්තතිය ප්‍රධාන වශයෙන් නියෝජනය කරනුයේ හස්තීන්, කඟවේනුන්, ගවරා, සිංහයා, හිපොපොටේමස් ආදී විශාල ක්ෂීරපායින් මෙන්ම කිරිඉබ්බන් සහ ගල්ඉබ්බන් ආදී උරගුන් ද වේ. මේ ෆොසිල පිළිබඳව 1940 දශකයේ සිටම එතුමා උනන්දුවෙන් තම පර්යේෂණ සිදුකළ බව ඔහුගේ ශාස්ත්‍රීය ලිපි අනුව සනාථ වේ. මැණික් ගරන්නන් විසින් ඔහුට ලැබෙන්නට සැලැස් වූ මේ ෆොසිල මඟින් නෂ්ටප්‍රාප්ත වූ ජෛවවිවිධත්වය පිළිබඳව සිත්ගන්නාසුළු විද්‍යාත්මක කරුණු ගොඩනැංවීමට එතුමා උත්සුක විය. අවිස්සාවේල්ල හා රත්නපුරය අතර වූ සමතල ප්‍රදේශය ප්ලයිස්ටොසීනයේ විශාල වගුරක්ව පැවති බවත්, එහි හිපොපොටේමස් ජීවත් වූ බවත් එම කලාපයෙන් සුලබව හමුවන හිපොපොටේමස් ෆොසිල අනුව එතුමා දක්වා ඇත. දත්වල ප්‍රමාණයන් හා එහි රූපවිද්‍යාත්මක ලක්ෂණ අනුව කඟවේනුන් හෙවත් රයිනෝසිරස් විශේෂ දෙකක් අප රට ජීවත් වූ බව දැරණියගලගේ ෆොසිල අධ්‍යයන මඟින් සනාථ වී ඇත. ගවරා පිළිබඳව දීර්ඝ වශයෙන් පර්යේෂණ පැවැත් වූ හෙතෙම පවසනුයේ අදින් වසර 200ක් පමණ වන තෙක් උන් ලක්දිව වනාන්තරවල විසූ බවයි. ගවර හිස්කබල් කොටස්, හකු, දත් ඇතුළු ශරීරයේ අනෙකුත් කොටස් මැණික් පතල්වලින් හමු වූ අතර ඒ ගවර විශේෂය අප රටට ආවේණික බව එතුමාගේ මතය විය.


එතුමාගේ ප්ලයිස්ටොසීන සොයාගැනීම් අතර සිංහයෙකුට අයත් ෆොසිල වූ හක්කේ පිහිටි දතක් හමුවීම මෙහි ලා විශේෂයෙන් සඳහන් කළ යුතුය. එවකට දකුණු ආසියානු කලාපයේ සිංහයින් පුළුල්ව වාසය කළ බව දැරණියගලගේ සොයාගැනීම් අනුව සනාථ වේ. වර්තමානයේ



පී.ඊ.පී. දැරණියගල මහතාගේ දියසායම් සිතුවමක්

ආසියානු සිංහයන් ගුජරාටයේ ගිර් නැමැති වනයට පමණක් සීමා වී ඇත.

දැරණියගල විසින් ප්ලයිස්ටොසීනයේ ජීවත් වූ, විද්‍යාත්මකව **හෝමෝ සිංහලේයුස්** සහ **හෝමෝ පිතෙකස් සිංහලේයුස්** නමින් වූ මානව විශේෂ දෙකක් පිළිබඳව විස්තර කොට ඇත. මීට අදාළ නළල් තල ප්‍රදේශයට අයත් හිස්කබල් කොටසක් සහ උඩු හණුවේ කෘන්තක දතක් එතුමාට හමු වී ඇත. නූතන භෞතික මානවවිද්‍යාව තුළ දැරණියගල විසින් හෙළිකෙරුණු මේ මානව විශේෂ දෙක වලංගු නොවූව ද හෝමොපිතෙකස් සිංහලේයුස්ට අයත් කෘන්තක දත නැවත පරීක්ෂා කිරීම සුදුසු යැයි සිතමි. මෙම දත ප්‍රමාණයෙන් ඉතා විශාල වන අතර පරිණාමීයව ප්‍රාථමික මානවයෙකුට අයත් යැයි රූපවිද්‍යාත්මක ලක්ෂණ අනුව පැහැදිලි වේ.



පී.ඊ.පී. දැරණියගල මහතා විසින් සිතුවම් කරන ලද ලංකාවෙන් වඳ වී ගොස් ඇති හස්තියෙක්



පී.ඊ.පී. දැරණියල මහතා විසින් අඳින ලද බලංගොඩ මානවයා

ප්ලයිස්ටොසීනයේ ජීවත් වූ එම සත්ත්ව සන්තතිය අනුව, වර්තමාන දේශගුණයට වඩා වෙනස් දේශගුණික තත්ත්වයන් එවකට පැවති බව එතුමාගේ අධ්‍යයන මඟින් සනාථ වේ. ග්ලැසියර හා අන්තර් ග්ලැසියර අතර උස් පහත් වූ මුහුදු මට්ටමත්, ඒ ඇසුරෙන් වෙරළබඩ තීරයේ රට තුළට වන්නට තැන්පත්ව ඇති බෙලිකටු නිධි පිළිබඳවත් තම ශාස්ත්‍රීය ලිපිවල විස්තර කොට ඇත. ප්ලයිස්ටොසීනයේ මුහුදු මට්ටම ඉහළ යෑම නිසා රට තුළ තැන්පත් වූ බෙලි කටු නිධි පිළිබඳව එතුමා තම පර්යේෂණ දියත් කළ අතර අකුරළ පිහිටි සමුද්‍ර තැන්පතුව පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලදී. ප්ලයිස්ටොසීනයට අදාළව එතුමා විසින් අධ්‍යයනය කරන ලද ෆොසිල කොළඹ කෞතුකාගාරයේ ස්වාභාවික විද්‍යා අංශයේ මැදිරිවලත්, රත්නපුර කෞතුකාගාරයේත් ප්‍රදර්ශනයට තබා ඇත. එතුමා ජීවත්ව සිටි සමයේ දී තම පර්යේෂණවලට භාජනය කළ සිංහ දත ඇතුළු තවත් විශේෂ ෆොසිල එකතුවක් ලන්ඩනයේ පිහිටි ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයට පරිත්‍යාග කොට ඇති අතර එම එකතුව 1996 දී මෙම කතුවරයා විසින් පර්යේෂණයට භාජනය කෙරිණි.

පී.ඊ.පී. දැරණියගල මහතාගේ සත්ත්වවිද්‍යාත්මක පර්යේෂණ ජීවිතය අතිශයින් වැදගත් වේ. සමුද්‍රජීවී විද්‍යාඥයෙක් ලෙස කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ රාජකාරියට බැඳුණු එතුමාගේ විශේෂ අවධානයක් සමුද්‍ර හා මිරිදිය මසුන් කෙරෙහි යොමු විය. ගැඹුරු මුහුදේ වසන පොතු මාළුවා, තෙත් කලාපයේ වැසි වනාන්තර ආශ්‍රිතව දිය කඩිතිවල වසන මල් පුළුට්ටා, හල්මල් දණ්ඩියා, ජොන්ක්ලාස් ඇහිරාවා ආදී නව විශේෂ නම් කිරීමත්, තවත් මත්ස්‍ය විශේෂවල උප විශේෂ තත්ත්වයන් පිළිබඳව ද ඔහුගේ අවධානය යොමු විය.

පෘෂ්ටවංශී සත්ත්ව කාණ්ඩ අතර එතුමා අඩුවෙන්ම පර්යේෂණවල නිරත වූයේ උභයජීවීන් පිළිබඳවය. හෙතෙම තෙත් සහ බුරුල් පසේ ජීවත්වන පාද රහිත උභයජීවී කාණ්ඩයක් වන හිරිදණ්ඩන් පිළිබඳවත්, පාද කීපයක් සහිත විකෘති තත්වයෙන් වූ උභයජීවීන් පිළිබඳවත් ශාස්ත්‍රීය ලිපි කිහිපයක් පමණක් ප්‍රකාශයට පත්කොට ඇත. දැරණියගල උරගයින් පිළිබඳව පර්යේෂණ සඳහා විශේෂ කැපවීමක් කළ බව පැහැදිලිය. මේ අතරින් ලංකාවේ ජීවත් වන සර්පයින්ගේ උප විශේෂ තත්ත්වයන් සහ එම විශේෂ දකුණු ඉන්දියානු සතුන් සමඟ දක්වන සබඳතා පිළිබඳවත් පුළුල් ලෙස විමර්ශනය කොට ඇත. මේ අතරින් වැලිපොළඟා, දාරපිඹුරා, මුදුකරවලා සහ වැලිපිඹුරා ආදී තවත් සර්ප විශේෂ කිහිපයක් එතුමාගේ විශේෂ අවධානයට යොමු විය. මීට අමතරව පොළොව තුළ ජීවත් වන පාංශු සර්ප විශේෂ කිහිපයක්ම එතුමා විසින් නව විශේෂ ලෙස නම් කරන ලදී. කටුසු විශේෂ අතර කරමල් බෝදිලියා, කුරුබෝදිලියා සහ අං කටුස්සන් ලංකාවේ උරග පරපුරේ මෙරට මුල්ම පදිංචිකරුවන් බවට එතුමා විසින් දක්වන ලද මත වර්තමාන DNA පර්යේෂණ ප්‍රතිඵල මඟින් ද සනාථ වීම තුළින් දැරණියගලගේ සත්ත්වවිද්‍යා දැනුම මොනවට පැහැදිලි වේ. දැරණියගලගේ විශේෂ අවධානයට ලක් වූ උරග කාණ්ඩ දෙකකි, කිඹුලන් සහ මිරිදිය ඉදිබුවන්. කිඹුලන්ගේ කැදලි තැනීම, බිත්තරවල විකසනය සහ හැසිරීම් රටා පිළිබඳවත් සමුද්‍ර කැස්බෑවුන්ගේ ඉහළ සහ පහළ ඵලකවල රූපවිද්‍යාත්මක ලක්ෂණ පිළිබඳවත් මැනවින් විස්තර කොට ඇත. වියළි කලාපයේ ගස් කඳන් අතර ජීවත් වන දිවාසැරි හූනෙකු වන පොඩි හූනා ඇතුළු සිකනළුන්, කබරගොයින් හා තලගොයින් පිළිබඳව ද තම අධ්‍යයනය පුළුල්ව සිදු කරන ලදී.



හස්තියෙකුගේ සිතුවමක්

පී.ඊ.පී. දැරණියගල ඉතිහාසය, භූ විද්‍යාව, පුරාවිද්‍යාව, පාෂාණීභූත විද්‍යාව, ඛණිජ පිළිබඳ විද්‍යාව, ජීව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, මානව විද්‍යාව, මානවවංශ විද්‍යාව ඇතුළු ක්ෂේත්‍ර ගණනාවකම ශාස්ත්‍රීය ලිපි පළ කොට ඇති, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් උගතෙකි. ඔහුගේ ශාස්ත්‍රීය ලිපි බොහොමයක් පළ වූයේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 'ස්පෝලියා සිලැනිකා' ශාස්ත්‍රීය සංග්‍රහයේය. ඊට අමතරව රාජකීය ආසියාතික සංගමයේ ශ්‍රී ලංකා ශාඛාවේ ප්‍රකාශනයේ ද පළවිය. ලොව අග්‍රගණ්‍ය ශාස්ත්‍රීය ප්‍රකාශනයක් වන Nature සඟරාවට තම ජීවිත කාලය තුළ ලිපි හතරක් සපයමින් එතුමා තමා සතු බුද්ධියේ මහිම ලොවට කියා පා ඇත. වසර 1947 දී එතුමා අප්‍රිකාවේ පැවැත් වූ ගවේශනය සමස්ත ශ්‍රී ලංකාවටම ගෞරවයක් ගෙන දුනි. ස්පෝලියා සෙලනිකා 25 වන වෙළුමට ඒ පිළිබඳව දීර්ඝ ලිපියක් සපයමින් එහි දී අනාවරණය කරගත් නව සොයාගැනීම් ප්‍රකාශයට පත් කොට ඇත. ඒ අනුව ඒ ගවේශනයේ දී නව හිපොපොටේමස් විශේෂ, මානව විශේෂ, හස්තීන්, ඉදිබුවන්, කිඹුලන් ඇතුළු මානව විද්‍යාත්මක තොරතුරු බොහොමයක් අනාවරණය කර ගනිමින් ලොව රටවල් කිහිපයකින් ඒ කණ්ඩායම නියෝජනය කළ විද්වතුන් අතර එතුමා ප්‍රමුඛත්වයක් හිමිකර ගත්තේය.

1945 දී එතුමාගේ දිවියේ විශේෂිත සොයාගැනීම් අතර අපගේ ආදිම මුතුන්මිත්තා හෙවත් ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා නොඑසේනම් 'බලංගොඩ මානවයා' පිළිබඳව අනාවරණය කිරීම අප රට ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සන්ධිස්ථානයක් විය. එතුමා එම මානවයා නව උප විශේෂයක් ලෙස නම් කළේය. එනම් 'හෝමෝ සේපියන් බලංගොඩෙන්සිස්' ලෙසය. මෙහි ප්‍රථම නිදර්ශකය එතුමා විසින් අනාවරණය කරන ලද්දේ රාවණාඇල්ල ගුහාව තුළින්ය. ඉන් අනතුරුව 1958 දී ස්පෝලියා සෙලනිකාහි 28 වන වෙළුමට දිගු ශාස්ත්‍රීය ලිපියක් ලියමින් බලංගොඩට ආසන්න වළවේ ගං ඉවුරේ බෙල්ලන්බැඳිපැලැස්සෙන් බලංගොඩ මානවයාට අයත් තවත් මානව අවශේෂ සොයාගන්නා ලදී. බලංගොඩ මානව අවශේෂ සමඟ එම මානවයා පරිහරණය කළ ශිලා මෙවලම්, සත්ත්ව අස්ථි මෙවලම්, දඩයමින් ඉතිරි අවශේෂ වූ සත්ත්ව අස්ථි සහ දත් ආදිය අනාවරණය කර ගැනීමට එතුමා සමත් විය. මේ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳව ස්විට්සර්ලන්ත ජාතික සරසින් සහ සරසින් යන දෙමස්සිනන්ට අමතරව සවිස්තරාත්මක විස්තරයක් සැපයීමේ ගෞරවය පී.ඊ.පී. දැරණියගලට හිමි වේ.

සිය හසල දැනුම සහ ශාස්ත්‍රීය ප්‍රකාශනයන් නිසා ලොව බොහෝ ආයතනවලට එතුමා සම්බන්ධ කරගැනිණි. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධුරය හොබවමින් රාජකීය ආසියාතික සංගමයේ සභාපති ධුරයේ ද, ඊට අමතරව ඇමෙරිකානු පෘෂ්ඨවංශී පාෂාණීභූත සංගමයේ ද, ඉන්දියානු සිස්ටමැටික් සුලොජි සංගමයේ ද, ඉන්දියානු



දැරණියගල මහතා විසින් නෙලන ලද ප්ලයිස්ටොසීනයේ ජීවත්ව සිට වඳ වී ගිය හස්තියෙකුගේ රුවක්



කළු කොල්ලාගේ තෝන්තු පහර

පැසිෆික් ධීවර කවුන්සිලයේ ද, ඉන්දියානු සත්ත්ව විද්‍යා ඇකඩමියේ ද, මිනිසා පිළිබඳ අධ්‍යයනයේ ඇමෙරිකානු පදනමේ ද, ලෝක ආහාර හා සෞඛ්‍ය සංගමයේ ද, ජාත්‍යන්තර ප්‍රාග් ඉතිහාසය පිළිබඳ කොන්ග්‍රසයේ ද, ප්‍රාග් ඓතිහාසික විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සංගමයේ ද, යුනෙස්කෝ සංවිධානයේ ද ඇතුළු ජාත්‍යන්තර සංවිධාන රැසක නිලතල ඉසිලීය. එතුමා වෙතින් විද්‍යා ක්ෂේත්‍රයට ඉටු වූ සේවයට ගෞරවයක් වශයෙන් 1960 දී විද්‍යෝදය විශ්ව විද්‍යාලය මඟින් ගෞරව ආචාර්ය උපාධියක් පිරිනැමිණි.

එතුමාගේ පුතුන් සතර දෙනා අතරින් ආචාර්ය සිරාන් උපේන්ද්‍ර දැරණියගල පියාගේ අඩිපාරේ යමින් මෙරට ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාවට අති විශාල සේවයක් ඉටු කළේය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරුවල වගකීම් ඉසිලූ හෙතෙම 90 දශකයේ දී එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර ද ඉන් අනතුරුව එහි උපදේශක තනතුර ද හෙබවීය. පසුගිය වසර 50 තුළ සමස්ත ශ්‍රී ලංකාව තුළම සිදුකළ ගවේශන හා කැනීම් අතර 'ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය' යන මැයෙන් ආචාර්ය නිබන්ධනය නිම කළ ආචාර්ය සිරාන් දැරණියගල 1992 දී එය ග්‍රන්ථයක් වශයෙන් ප්‍රකාශයට පත් කළේය. එම ග්‍රන්ථය ශ්‍රී ලංකාව තුළ පමණක් නොව සමස්ත දකුණු ආසියාවේම ප්‍රාග් ඉතිහාසය පිළිබඳව වූ මව් පොත ලෙස සැළකිය හැකිය. තම පියා කැනීම් හා ගවේශනය කළ ස්ථානයන් නැවතත් පර්යේෂණයට භාජනය කරමින් නූතන කාලනීර්ණ ක්‍රමවේදයන්ට අනුව කාලනීර්ණය කරමින් නව මත සහ අදහස් ඉදිරිපත් කළේය. ආචාර්ය සිරාන් දැරණියගලගේ සොයාගැනීම් අතරට බුන්දල වැලිකඳු අතරින් හමු වූ වසර 1,25,000ක් පැරණි ශිලා මෙවලම් සහ වසර 37,000ක් පැරණි ස්ථරණයක් ඇති කුරුවිට බටදොඹලෙන විශේෂයෙන් සඳහන් කළ හැකිය. ආචාර්ය සිරාන් දැරණියගල කුඩා කළ සිටම ඔහුගේ පියා වූ පී.ඊ.පී. දැරණියගල සමඟ ගවේශන සහ කැනීම්වලට සහභාගී විය. ඒ තුළින් හෙතෙම පියාගේ ආදර්ශය සහ මඟ පෙන්වීම නොඅඩුව ලද බවට සැකයක් නැත.

පී.ඊ.පී. දැරණියගල මහතා ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික අධ්‍යයනවල නව මාවතක් විවෘත කළ අතර ආචාර්ය සිරාන් දැරණායගල එහි බොහෝ දුර ගමන් ගත්තේය. සිරාන් දැරණියගල මහතා තම සේවය හා අත්දැකීම් නොඅඩුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලබා දෙමින් ප්‍රාග් ඓතිහාසික හා ප්‍රොටෝ ඓතිහාසික යන යුගයන් පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කළේය. ඔහු ඒ අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු අධක්ෂ ජනරාල්වරයෙකු වූ ආචාර්ය ඩබ්. විජයපාල සහ වර්තමාන නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය නිමල් පෙරේරා සමඟින් අනුරාධපුර ඇතුළුනුවර හා  වසර 40,000ක් පැරණි බුලත්සිංහල ෆාහියන් ලෙන, දොරවක ලෙන, කෑගල්ල අළුලෙන,



විල් අලියෙක්

පල්ලෙමලල, මිණිඇතිලිය ආදී ඉතා සංකීර්ණ වූ කැනීම් ගණනාවක්ම මෙහෙයවන ලදී. මීට අමතරව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මහාචාර්ය ගාමිණී අදිකාරි සීගිරිය අසල පොතාන, අලිගල සහ අලවල පොත්ගුල්ලෙන යන ප්‍රාග් ඓතිහාසික ලෙන් කැනීම් කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාවට දායක විය. සමකයට ආසන්න



දුටුගැමුණු එළාර යුද්ධය

රටක් ලෙස ජෛවවිවිධත්වයෙන් ඉතා ඉහළ රටක් වූ ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය ගුහා කැනීම් ද ඉතා සංකීර්ණ වේ. ඉතා තුනී සංස්කෘතික ස්තර සහිත සංකීර්ණ ගුහා කැනීම සහ නිවැරදිව දත්ත පෙළ ගැසීම පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ අතිශයින්ම සංකීර්ණ ක්‍රියාවලියකි. පී.ඊ.පී. දැරණියගල විසින් නව මාවතකට යොමු කරන ලද ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා පර්යේෂණ තව දුරටත් විද්‍යාත්මක ක්‍රමවේද මත සංයමයකින් යුතුව පවත්වාගෙන යාම පිළිබඳව අප ඔවුනට ස්තූතිවන්ත විය යුතුය.




බෙල්ලන්බැඳුපැලැස්සෙන් අනාවරණය වූ බලංගොඩ මානව සැකිල්ලක් (1956)

**පී.ඊ.පී. දැරණියගල මහතා විසින් නිර්මාණය කරන ලද තවත් සිතුවම් කීපයක්**



දිවාසැරි පොඩි හූනා



කරමල් බෝදිලියා



කිරි ඉබ්බා



පොතු කැස්බෑවා



දාර කැස්බෑවා



උකුසු පැටවෙක්

# වංකගිරිය

ඩබ්ලිව්. ඒ. ගිහාන් කල්‍යාණ

**සාහිත්‍ය මූලාශ්‍ර**

ඉපැරණි රාවණා රාජධානිය වංකගිරි සැළසුමකට අනුව නිර්මාණය කරනු ලැබූවක් බව ඉරාන ජාතික සුප්‍රකට භූ විද්‍යාඥයෙකු වන අබුල් රෙහාන් අල් බුරුනි විසින් සඳහන් කර තිබේ. [1910 translation of Al-Beruni's *India* (c.1,030CE) p.306] එකල ත්‍රිකූට රාජධානිය චක්‍ර රත්නයක් විසින් ආරක්‍ෂා කර තිබූ බව රාමායනයෙහි ද දක්වා ඇත. මේ හේතුවෙන් වානර හමුදාවේ බොහෝ පිරිසක් රාවණා රාජධානියට ඇතුළුවීමටත් පළමුවෙන් විනාශ වූ බවත් එහි සඳහන් ය. ඒ අනුව සලකා බලන කල්හි පැරණි යුධ ආරක්‍ෂණා වැඩ පිළිවෙලක් වශයෙන් මෙම වංකගිරි සැළැසුම හෙළයන් විසින් අතීතයේ දී භාවිත කල බව සදහන් කල හැකි වේ. ලෝකයේ දැනට හමු වී ඇති පැරණිතම යුධ උපක්‍රම හා රාජධානි සැළසුම්කරණය අතින් උසස් ශිල්පීය ඥානයක් හෙළයන් සතුව තිබූ බව මේ අනුව සිතිය හැකි වේ. එසේම පැරණි කොන්ස්තන්තිනෝපල් නගරය ද මෙවැනිම වංකගිරි සැළසුමකට අනුව ඉදිකර තිබූ බව ඉරාන ජාතික භූ විද්‍යාඥයකු වන අල් කුස්විනි විසින් ද සදහන් කර ඇත. කෙසේ වෙතත් ඉහත මූලාශ්‍ර දෙකෙහි ම පුරා විද්‍යාත්මක සාක්‍ෂි කිසිවක් ඉතිරිව නොමැති බැවින් සාහිත්‍යය මූලාශ්‍රයන් බවට පමණක් පත් ව තිබේ.

මහාභාරත කතාවෙහි සදහන්වන ආකාරයට කුරුක්ෂේත්‍ර සංග්‍රාමයෙහි දී ආචාර්ය ද්‍රෝණ විසින් කෞරවයින් විනාශ කරනු වස් දෙවියන්ට ද ජයගත නොහැකි යුධ ශිල්පයක් හඳුන්වා දුන් බව කියවේ. එකල එය චක්‍ර ව්‍යුහය නම් විය. මෙවැනි යුධ උපක්‍රමයක් ජයගත හැකි ආකාරය ආචාර්ය ද්‍රෝණ විසින් සිය දක්‍ෂතම ශිෂ්‍යා වූ පාණ්ඩව පුත්‍ර අර්ජුන වෙත පමණක් ගුරු මුෂ්ඨියක් ලෙස උගන්වා තිබූ නමුත් යුද්ධයේ පැවති බිහිසුනු බව හේතුවෙන් අර්ජුනයන් මෙම සටනට පැමිණීමට පළමුවෙන් මේ උපක්‍රමය පිළිඹද අත්දැකීමක් නොතිබුණු ඔහුගේ පුත්‍ර අබිමන්‍යු විසින් පෙර දී අසා තිබූ පරිදි චක්‍ර ව්‍යුහය තුළට ඇතුළු වන අතර ඉන් පිටවීමට නොදත් බැවින් මරණයට පත්වන්නට සිදු වේ. මෙම තොරතුරුව වලට අනුව අඳිනු ලැබූ සාම්ප්‍රදායික වංකගිරි සටහනක් කුරුක්ෂේත්‍ර කාලි කොවිලෙහි දක්නට ලැබේ. මයිසෝරයේ ක්‍රිස්තු වර්ෂ 12-13 සියවස්වලට පමණ අයත් හොයිසලේෂ්වර හා කදිරේෂ්වර දේවාලයන්හි මහාභාරත කතාවෙහි සදහන් වන චක්‍ර ව්‍යුහය හා කුරු සංග්‍රාමයෙහි පැවති යුධ ශිල්පී අවස්ථාව සූක්‍ෂම ලෙස ගල් කැටයමක සර්පිලාකාරව කැටයම් කර තිබේ.

මූලික වශයෙන් ඉන්දියානු වෙළෙඳ සංස්කෘතිය ඔස්සේ ලෝකය පුරා මෙම වංකගිරි සංකල්පය ව්‍යාප්ත වන්නට ඇතැයි අනුමාන කරනු ලබන අතර මෙම සංඛේතය, මධ්‍යාසියාව හරහා සිරියාවෙහි පෙට්‍රොග්ලයිපස් ගුහා සිතුවම් අතරත් පසුව හෙළනීසියානු රෝම අභාෂය ඔස්සේ රෝම අධිරාජ්‍ය පුරාත් පැතිර යන්නට ඇතැයි විද්වතුන් සඳහන් කර ඇත. කිසියම් වූ යුධ ආරක්‍ෂණා සැළසුමක් වශයෙන් සමස්ත ලෝකය පුරා පසු කාලීනව ජනප්‍රිය වන්නට ඇතැයි නිෂ්චය කල හැකි මෙම ශිල්පීය උපක්‍රමය බටහිර ඩෙඩුලස් පුරාවෘතයෙහි ද අන්තර්ගත වේ. මිනෝස් රජුගේ නොසස් නම් කාමර 1,500ක් සහිත වංකගිරි මාළිගාවෙහි සුවිසල් රංග ශාලාවක් ද උත්සව අවස්තාවන්හි දී ගොන් පොර හා ගලැඩියේටර් සටන් පැවැත් වූ අංගනයන් ද අභ්‍යන්තර දිය ඇලි හා දිය බැස යන නල පද්ධතියකින් ද ලීවර යොදාගත් සෝපාන පහසුකම් ද විවිධ වර්ණයන් ආලේප කල බිත්ති ද තිබූ බව පුරාවෘත වල දක්වා තිබේ.

ඊජිප්තුවේ තුන් වන අමේන්මෙහෙට් ෆේරෝ විසින් Amenemhet III හවාරාහි ක්‍රි.පූ.1855 - 1808 දී තනනු ලැබූ මෝර්ටුවරි සිද්ධස්ථානය ද සුප්‍රකට වංකගිරි සැළසුමක් සහිත පිරමීඩයක් පැවති බව හෙරඩෝටස් විසින් සදහන් කොට තිබේ. කාමර තුන්දහසකට වඩා වැඩි දැවැන්ත මාළිගා පරිශ්‍රයක් ලෙස මෙම වංකගිරි සිද්ධස්ථානය පැවති බව ජ්‍යේෂ්ට ප්ලීනි ද වාර්තා කර තිබේ. මේ වන විට කැනීම් කොට ස්ථිර වශයෙන් ම සොයාගෙන ඇති ඉහත සදහන් කල ගොඩනැගිලි ද්විත්වයෙහි නශ්ඨාවශේෂ පිළිඹද වැඩි දුරටත් අධ්‍යනයන්ට ලක් කරමින් පවතී.

**ජාතක පොතෙන් ...**

චේතිය නුවර සිට යොදුන් පහළොවක් ගෙවා විපුල පර්වතය ද අනතුරුව ගන්ධමාදන පර්වතය ද ඉන් අනතුරුව මහා වනය ගෙවා ගිය පසු ඛේතුමතී ගංගාවෙන් එතෙරව සානු පර්වතය පසු කොට ඊ තණ වනය ද ගෙවා මුචලින්ද විලට ද එතැන් සිට ඊසාන දිසායෙහි පිහිටි සතරැස් පොකුණට පැමිණ ඉන් දකුණු දිසාවට ගිය කල්හි අතිශය නිර්මල වූ වංකගිරිය හමුවන බව වෙස්සන්තර ජාතක කතාවෙහි දක්වා තිබේ. පන්සිය පනස් ජාතක පොතෙහි ගෞතම බුදුන්වහන්සේගේ මහා දාන පාරමිතාව දක්වන 539 වන වෙස්සන්තර ජාතකයෙහි වංකගිරිය සම්බන්ධයෙන් අතිශය දීර්ඝ වර්ණනාවක් සහිතව මහා වන මැද කදුකරයෙහි පැවති මෙම ගමන් මාර්ගයෙහි පැවති දුෂ්කර වූත් ජනශූන්‍ය වූත් ස්වභාවික ආරක්ෂිත බව මැනවින් විස්තර කොට දක්වා දී තිබේ.


**බිතුසිතුවම් අතර ...**

පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර

ඒ අනුව මෙම කරුණු සිත්හි තබා ගනිමින් සිතුවම් කරනු ලැබූ දඹුල්ලෙහි අංක 3 දරන









වංකගිරි සටහන් සහිත දුම්බර පැදුරු හා කෝලම් චිත්‍ර සටහන්



ලෙන් පියස්සෙහි ඉතා කලාත්මකව අඳින ලද හිමාලය හා අනෝතප්ත විලෙහි දර්ශනය ඉපැරණි වංකගිරි සංකේතය සිහිගන්වනු ලැබේ. ශ්‍රී ලංකාවට ආවේනික ස්වරූපයකින් යුක්ත වූ පොළොන්නරුවේ නෙළුම් පොකුණෙහි ස්වරූපයකින් යුක්ත මෙම රූපයෙහි සාහිත්‍යයේ ඇති විස්තර වලට අනුව වඩාත් සංකීර්ණ රේඛා සටහන් යොදා ගනිමින් මෙම නිර්මාණය කර තිබීම විශේෂ වේ. මෙම සිතුවම ගුරු කොට ගනිමින් මහනුවර යුගයෙහි සිතුවම් කරනු ලැබූ රත්නපුර කොට්ටිඹුල්වල වලගම්බා රජමහා විහාරයෙහි ඇඳ ඇති අනෝතප්ත විලෙහි දර්ශනය එතරම් සවිස්තර තොරතුරු සහිත නොවූ සිතුවමක් වුව ද මූලික වංකගිරි සම්ප්‍රදායෙහි ආභාසය මෙතුළින් ද දැකිය හැකි වේ. මෙම සංඛේතය ප්‍රායෝගිකව ලේඛන කලාවට ද යොදා ගත් බව පෙන්වනු ලබන සටහනක් පඬුවස්නුවරින් හමු වී ඇති අතර ගලෙහි ඇති සීමිත ඉඩ උපරිමයෙන් යොදා ගැනීම උදෙසා එකල ශිල්පීන් යොදා ගත් උපක්‍රමය වංකගිරි සම්ප්‍රදාය වශයෙන් හඳුන්වා දිය හැකි වේ. නිශ්ශංකමල්ල රාජසමයට අයත් මෙම ආසන සෙල්ලිපිය මෙතෙක් පැවති සාම්ප්‍රදායික ලේඛන ශෛලියෙන් මිදී සමානව බෙදූ ජ්‍යාමිතික චතුරස්‍රාකාර සර්පිලාකාර රේඛාවක වමේ සිට දකුණට රචනා කොට තිබීම විශේෂ වේ.

මහනුවර අවධිය වන විට විහාරයන්හි අඳිනු ලැබූ සිතුවම් අතර ඉතාම ජනප්‍රිය සිතුවමක් වූ වෙස්සන්තර ජාතකයේ දක්නට ලැබෙන "මන්ද්‍රි දේවිය වංකගිරියෙහි මංමුලා වීම" කුරුණෑගල බිහල්පොල රජමහා විහාරයෙහිත් මහනුවර මැදවල රජමහාවිහාරයෙහිත් කැලණිය හා අරත්තන රජමහාවිහාර වල සිතුවම් කර තිබේ. දේශීය අනන්‍යතාවක් සහිතව නිර්මාණය කර ඇති මෙම සිතුවම් අතලොස්සෙන් කිහිපයක් අදවන විටත් විනාශ වී යාමේ උවදුරකට පත්ව ඇත. ලංකාවෙහි අදටත් දැකිය හැකි මෙම දුර්ලභ සිතුවම් කීපය කෙරෙහි බලධාරීන්ගේ වැඩි අවධානයක් යොමු වී නැතත් ඒ පිළිබඳ විශේෂ අධ්‍යනයට ලක් කොට සංරක්ෂණය කලයුතු බව සිහිගැන්විය යුතු වේ.



සංරක්ෂණය කොට ඇති මැදවල රජමහා විහාරයෙහි වංකගිරි සටහන

**ගල් කැටයම් අතර ...**

බෞද්ධ කතා තේමාවට උචිත ආකාරයෙන්ම කාලීන වශයෙන් බොහෝ දෙනාගේ අවධානය දිනාගෙන තිබූ සාහිත්‍ය කරුණු සනාථ වන ආකාරයෙන් ඉන්ද්‍රිය ආභාෂයට අනුව මෙම නිර්මාණය සිදුකරන්නට ඇතිබව කලාත්මකව අධ්‍යනයට ලක් කිරිමේ දී දැකිය හැකි වේ. ඒ අනුව මහනුවර සම්ප්‍රදායෙන් එපිට මෙම සළකුණ දක්නට නොලැබීම හේතුවෙන් පසුකාලීනව ලක්දිවට එල්ල වූ ඉන්දීය බලපෑම මීට හේතු වන්නට ඇතැයි අනුමාන කල හැකි වේ.

මීට හාත් පසින් වෙනස් චක්‍ර රටාවකින් යුක්ත සටහනක් ඉසුරුමුනි විහාරයට මායිම්ව පිහිටි රන්මසු උයනින් හමු වී ඇති මුත් කිසිදු කාල නිර්ණයකින් තොරව ඉසුරුමුනි විහාරයත් රන්මසු උයනත් තිසා වැවත් අතර පවත්නා සහ



සම්බන්ධයෙන් බැඳුණු ඓතිහාසික බැඳීම වෙන් වෙන් වශයෙන් විග්‍රහ නොකල යුතු බැවින් මෙය වංකගිරි සටහන්ක්ම දැයි පිළිගැනීම දුෂ්කර වී තිබේ. මෙම නටබුන් පරිශ්‍රයෙන් හමු වූ ප්‍රකට රජ පවුල, පෙම් යුවල, මිනිසා සහ අශ්ව හිස යන කැටයම් වලින් ද මෙම සටහන වෙනත් කටයුත්තක් සඳහා නිම කරන්නට ඇති බව නිගමනය කල හැකි මුත් ඇතැමුන් මෙම සටහන රාවණ යුගය දක්වා ඉපැරණි බව සඳහන් කරනු ලබන බැවින් ඉපැරණි රාවණ රාජධානියෙහි වංකගිරි සැළසුම මෙය ද යන්න විමසා බැලිය යුතු කරුණක් වේ.

ශ්‍රී ලංකාව පුරා වංකගිරිය ආශ්‍රිත සිතුවම් කෙතරම් සාමාන්‍ය කරනයට ලක් වූයේ ද යත් මහනුවර යුගයෙහි නියඳ පැදුරු වලට මෙන්ම දුම්බර පැදුරු රටාවන් තුළට ද මෙම වංකගිරි සංකේතය ඇතුළත්ව තිබුනි. ඉතා අනර්ඝ අන්දමින් සකස් කරනු ලැබූ සත්ත්ව සටහන් අතරට වංකගිරිය යෙදීම අතිශය දුෂ්කර පැදුරු රටාවක් බව පැරණි ගැමියන් දක්වා තිබේ. එය පැරණි ගැමි ලියන් සිය දක්ෂතාව පෙන්නුම් කරනු ලැබූ කඩඉම් විභාගයක් විය. එසේම ඇතැම් දමිළ උත්සව අවස්ථාවන්හි දී මෙම සටහන යෙදූ කෝළම් රටාවන් මිදුලෙහි දැක්වීමත් ඇතැම් මැටියෙන් කල ගැමි නිවාස වල හුණු වලින් මෙම සටහන යොදා තිබීමත් ඇතැම් පලාත්වල අඳිනු ලබන කමත් යන්ත්‍රයෙහි තබන කොහොඹා ලෑල්ලෙහි මෙම සංඛේතය යෙදීමත් පිළිඹඳ සුළු වශයෙන් හෝ වාර්තා හමු වී තිබේ. මේ පිළිඹඳ ආනන්ද කුමාරස්වාමි මහතා ද මධ්‍යකාලීන සිංහල කලාව පොතෙහි ද ඡායා රූප සහිතව තොරතුරු දක්වා ඇති අතර එවැනි රටා යොදන ලද සටහන් අදටත් සුළු වශයෙන් හෝ ගම්බද නිවෙස් වලින් දක්නට ලැබීම වර්තමානය දක්වාම මෙම වංකගිරි සැළසුම සම්බන්දයෙන් සිංහලයන් තුළ අවිඥානකව හෝ පැවති සම්බන්දය දැක්විය හැකි සාධකයක් ලෙස සඳහන් කල යුතු වේ.

ලෝකය පුරා විවිධ සංස්කෘතීන් අතරින් හමු වී ඇති වංකගිරි සටහන් අතර පොදු සමානත්වයක් දක්නට හැකි වීම පුදුම සහගත කරුණක් වන නමුත් කුමන කරුණක් උදෙසා මෙය පොදුවේ භාවිතයට ගනු ලබන නමුත් එම මූලාශ්‍රය පැහැදිළිව නිශ්චය කල හැකි නොවේ. බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි මෙන්ම මුස්ලිම් යන ආගමික ප්‍රජාව අතර එකසේ ජනප්‍රිය වූ මෙම වංකගිරි සළකුණ විශ්වයටම පොදු සංඛේතයක් ලෙස දැක්විය හැකි වේ.





විනාශයට පත්ව ඇති බිහල්පොල රජමහා විහාරයෙ වංකගිරි සටහන






නිශ්ශංකමල්ල රජු විසින් නිකුත් කල වංකගිරි සම්ප්‍රදායේ ආසන ලිපිය

# දකුණු ලකෙන් හමු වූ අපූරු මැටි කුටීරය
# ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ද? නො එසේනම් මධ්‍යකාලීන ද?

- පී. ඊ. පී. දැරණියගල විසිනි -



මැටි කුටීරය (මෙයින් ගැඹුර දැක් වේ.)



කුටීරයේ සාමාන්‍ය හැඩය

1952 දී මාතර - අකුරැස්ස මාර්ගයේ හතරවැනි සැතපුම් කණුව ආසන්නයේ බණ්ඩත්තර පිහිටි කඳු බෑවුමක ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ කම්කරුවන් විසින් කැනීමක් සිදුකරන ලදී. එහි දී ඔවුනට හමු වූ අපූරු මැටි කුටීරය (Clay Structure) (අ) කඳු සේදී ඒමේ දී ඇති වූ රොන්මඩ තැම්පත් වීමෙන් සැලකිය යුතු පෞරාණිකත්වයක් ලැබුවා විය හැක. එසේ නැතිනම් (ආ) එම හැඩයම සහිත ව කපන ලද වළක බිත්ති මත අතුරණ ලද නොපිළිස්සූ මැටි ආලේප කිරීමෙන් සකස් කරන ලද්දක් විය හැක.

අනාවරණය වී ඇති ආයත චතුරස්‍රාකාර මෙම කුටීරය අඩි 10ක් ගැඹුරු අඩි 3-4 දක්වා පළලින් හා අඩි 15ක දිගකින් යුක්ත ය. ඡායාරූපයේ දැක්වෙන පරිදි එහි සැලකිය යුතු ප්‍රමාණයක් පොළොව මට්ටමට වඩා පහළින් පිහිටා ඇත. එහි අඩංගු දෑ කම්කරුවන් විසින් පරීක්ෂා කරන ලදුව පස් තට්ටුවක හෝ දෙකක මිනිසෙකුගේ මිටිගුලිය හා සමාන රවුම් ගල් හා ඊට ඉහළ තට්ටු 3ක් හෝ 4ක් මිනිසෙකුගේ හිස තරම් විශාල ගල් බෝල සහිත බව නිරීක්ෂණය විය. ඒ සියල්ලට පහළින් සත්ත්ව නොවන පිළිස්සී ගිය ද්‍රව්‍ය සහිත ස්තරයක් කම්කරුවන්ගේ නිරීක්ෂණයට ලක් විය. එම ද්‍රව්‍ය අතර වළං කැබලි ද පැවතිණ. මෙහි පැවති පිළිස්සී ගිය ද්‍රව්‍ය අතුරින් බොහෝ ප්‍රමාණයක් පොහොර වශයෙන් භාවිත කිරීමට ඉවත් කරගෙන ගොස් තිබූ අතර අනෙක් කොටස් පස් සමඟ මිශ්‍ර වී අවුල් වී පැවතිණ.

මෙම මැටි ව්‍යුහය නියමාකාරයෙන් තේරුම් ගැනීම අපහසු නමුත් එය පහළ දැක්වෙන කුමක් හෝ විය හැක.

අ) මහාශිලා සුසානයක් - නමුත් දැවී ගිය අස්ථි හමු නොවීම මීට ප්‍රතිවිරුද්ධ පවතින සාධකයකි

ආ) යකඩ නිස්සාරණය සඳහා භාවිත කළ උදුනක්

ඇ) වානේ සකස් කිරීමට භාවිත කළ උදුනක්

ඈ) මැටි බඳුන් පිළිස්සීමට භාවිත කළ පෝරණුවක්

ඉ) තෙල් බෙහෙත් සකස් කළ ස්කාගාරයක්

ඊ) රෝග සුවකර ගැනීමේ හෝ ආගමික අරමුණෙන් යක්ෂයින් සඳහා පුදපූජා පැවැත් වූ ස්ථානයක්

මෙම කුටීරය තුළ හමු වූ ගල්, අඳුරු රතු පැහැයක් ගත් අතර ඒවා තුළ අධික වශයෙන් යකඩ අන්තර්ගත විය. මෙම ගල් හා සමාන ගල් මේ ආශ්‍රිත ප්‍රදේශයේ බහුලව හමු වන හෙයින් මේවා තෝරා ගැනීම අහම්බයක් විය හැක. නමුත් යකඩ නිස්සාරණයේ ප්‍රතිඵලයක් ද විය හැක. එසේම ප්‍රාග් ඓතිහාසික මානවයා මෙම රතු පැහැති ගල් සමහර සුසාන පිළිවෙත් සඳහා භාවිත කර ඇත්තේ එහි වර්ණය ලේ පැහැය සමඟ සමාන නිසා ද විය හැක. වළං කැබලි ප්‍රාග් ඓතිහාසික ව්‍යුහයට වඩා වර්ධිත බවක් දක්වන හෙයිනුත් මෙතෙක් එයින් සත්ත්ව කොටස් අනාවරණය කරගැනීමට සමත් ව නැති හෙයිනුත් මෙම කුටීරය ප්‍රාග් ඓතිහාසික යුගයට අයත්ය යන මතය එතරම් සාධාරණ වූවක් නොවේ. මෙම ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා ඇති එකම විසඳුම එහි අන්තර්ගතය විද්‍යාත්මක පරීක්ෂණයට ලක් කිරීම පමණක් වන නමුදු එහි අන්තර්ගතය ඉතා තදින් අවුල් වී ඇති බැවින් එය ද දුෂ්කර කාර්යයක් වී ඇත.

(මෙම සිංහල ලිපිය 1952 දී ප්‍රකාශයට පත් වූ පහත දැක්වෙන ලිපියේ අනුවර්තනයකි.)

P.E.P. Deraniyagala (1952), A Curious Clay Cist from South Ceylon - Prehistoric or Medieval? *Ceylon Today*, November 1952 Vol. I No. 3, The Ceylon Government Information Department.




# විශේෂ අවස්ථා



මහාචාර්ය ජගත් වීරසිංහ මහතා පිළිගැනීමේ කතාව කරමින්



උත්සවයට සහභාගි වූ ප්‍රධාන ආරාධිතයින් (වමේ සිට) මහාචාර්ය ජගත් වීරසිංහ මහතා, අමාත්‍ය ජගත් බාලසූරිය මහතා, පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි, මහාචාර්ය ගාමිණී සමරනායක මහතා, ආචාර්ය සිරාන් දැරණියගල මහතා (හා ගාමිණී අදිකාරි මහතා)



ආචාර්ය සිරාන් දැරණියගල මහතා ප්‍රධාන දේශනය සිදුකරමින්



මහාචාර්ය රාජ් සෝමදේව මහතා හැඳින්වීමේ දේශනය සිදුකරමින්



පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි, මහාචාර්ය ගාමිණී සමරනායක මහතා, ආචාර්ය සිරාන් දැරණියගල මහතා



මහාචාර්ය ගාමිණී අදිකාරි මහතා විමසුම් දේශනය සිඳකරමින්



මහාචාර්ය නලින් ද සිල්වා මහතා අදහස් දක්වමින්



උත්සවයට සහභාගී වූ පිරිසෙන් කොටසක්



උත්සවයට සහභාගී වූ පිරිසෙන් කොටසක්



ආචාර්ය නිමල් පෙරේරා මහතා අදහස් දක්වමින්



ආචාර්ය අර්ජුන තන්තිලගේ මහතා අදහස් දක්වමින්



ජ්‍යෙෂ්ට සහකාර ලේඛකාධිකාරි කැප්පෙටියආරච්චි මහතා ස්තුති කතාව පවත්වමින්


**සංස්කරණය**
චන්දිම අඹන්වල
chandima@archaeology.lk
+94 71 835 8452

**කර්තෘ මණ්ඩලය**
මහින්ද කරුණාරත්න
mahinda@archaeology.lk
+94 71 839 0944

**තොරතුරු තාක්ෂණික සේවා**
අනුරාධ පියදාස
anuradha@archaeology.lk
+94 71 842 9393 / +94 77 742 8282

**archaeology.lk කණ්ඩායම**
අනුරාධ පියදාස
චන්දිම අඹන්වල
මහින්ද කරුණාරත්න
සන්ධ්‍යා නවරත්න මැණිකේ